# II වැනි පන්තියේ පොල් ඉඩම් ප්‍රදේශයෙන් තෝරාගන්නා ලද ගම් හයක් පිළිබඳව විශේෂ අවධානය ඇතිව කොළඹ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ව්‍යාප්තිය, පුහුණුකිරීම හා සංනිවේදනය පිළිබඳ අධ්‍යයනය


- සමීර අස්මාර්
- එස්. බී. ආර්. නිකහැටිය
- එල්. ජී. යාපා



පර්යේෂණ අධ්‍යයන මාලා අංක. 9 ජූලි 1975

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

තැ: පෙ: 1522 - කොළඹ

2009/06

2010/04

# II වැනි පංතියේ පොල් ඉඩම් ප්‍රදේශයෙන් තෝරා ගන්නා ලද ගම් හයක් පිළිබඳව විශේෂ අවධානය ඇතිව කොළඹ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ව්‍යාප්තිය, පුහුණුකිරීම හා සංනිවේදන පිළිබඳ අධ්‍යයනය

MFN 11411

සමීර් අස්මාර්

එස්. බී. ආර්. නිකහැටිය

එල්. පී. යාපා

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත, කොළඹ 7

පර්යේෂණ අධ්‍යයන මාලා අංක 9 1975 ජූලි

22124

පුස්තකාලය
LIBRARY
ගො. ක. ප. හා. පු. ආ.
HARTI

22124

# පෙරවදන

ගොවිකටයුතු පිළිබඳ නවීන ක්‍රම ප්‍රයෝජනයට ගැනීමේදී අධ්‍යාපනය හා පුහුණුව මගින් ගොවිජනතාව ලබා ගන්නා දැනුම හා දක්ෂතාවයන් සංවර්ධනයේ වැදගත් සාධකයකි. පර්යේෂණ මධ්‍යස්ථාන වලින් නවීකරණය හා නව දැනුම පිළිබඳ පණිවිඩ ගොවි ජනතාව වෙත ගෙන යන ප්‍රධාන නියෝජිතයා වනුයේ ව්‍යාප්ති සේවකයාය. එහෙයින් කෘෂිකාර්මික සංවර්ධනයේ වේගය බොහෝදුරට නිගමනය කෙරෙනුයේ ව්‍යාප්ති සේවයේ කාර්යක්ෂමතාවය මගිනි.

කොළඹ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ව්‍යාප්තිය, පුහුණුව හා සංනිවේදනය පිළිබඳ මෙම අධ්‍යයනය, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය ආරම්භ කර ඇති II වෙනි පංතියේ පොල් ඉඩම් පිළිබඳ අධ්‍යයනයේ කොටසකි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනු ලැබෙන ව්‍යාප්ති සේවය පිළිබඳව විශේෂ සැළකිල්ලකින් යුතුව, ප්‍රදේශයේ ගොවි ජනතාවගේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන නොයෙකුත් ව්‍යාප්ති සංවිධානයන්හී ස්වභාවය, විෂය සීමාව හා කාර්යයන් මෙම අධ්‍යයනයෙහිදී කෙටියෙන් පරීක්ෂා කෙරේ. අධ්‍යයනයෙන් සොයා ගනු ලැබූ කරුණු මත පදනම් වී ඇති නිගමන හා නිර්දේශ කොළඹ දිස්ත්‍රික්කයට පමණක් අදාළ වන හෙයින් මුළු රටම පිළිබඳව සලකන කළ ඒවායේ අදාළ බව සීමිත වන්නේය. වාර්තාවේ අඩංගු යෝජනා හා නිර්දේශ කෙරෙහි නිසි බලධාරීන්ගේ සැළකිල්ල යොමුවේ යැයි අපේක්ෂා කෙරේ.

සී. නාරායනසාමි
අධ්‍යක්ෂ

ස්තූතිය

කොළඹ දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී විසින් අපට දෙන ලද සහාය බෙහෙවින් අගය කරන අතරම දත්ත රැස් කිරීමේදී උදව් කළ ඔහුගේ කෘෂිකර්ම උපදේශකවරුන්ට හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ටද ස්තූති කරනු කැමැත්තෙමු. අවශ්‍ය තොරතුරු අප වෙත සැපයීමට කැමැත්තෙන්ම ඉදිරිපත් වූ මීගමුව ප්‍රාදේශීය කාර්යාලයේ පොල් සංවර්ධන නිලධාරීන්ටත්, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්ටත් ස්තූති කරමු. මේ හැමටත් වඩා, තොරතුරු සැපයීමේදී සිය සහයෝගය දැක්වූ, තෝරා ගත් ගම් හයෙහි ගොවිමහතුනට අපගේ ස්තූතිය පිරිනැමේ.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ සී. නාරායනසාමි, ප්‍රධාන උපදේශක ප්‍රෑන්ක් සෝන්ඩර්ස් හා පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී ර්. කේ. පෙරේරා මහතුන්ගෙන්, මෙම වාර්තාව සකස් කිරීමේදී ලැබුණ වටිනා අදහස් හා යෝජනා අගය කරමු.

ඉතාමත් සුළු කාලයක් තුළ වාර්තාව සිංහලෙන් සකස් කළ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී එ/ප්. ඒ. ද එස්. එම්. අබේරත්න මහතාටත්, සිංහල පිටපත සංස්කරණය කළ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී ආරියපාල සිරිවර්ධන මහතාටත් ස්තූති කරමු.

පටුන


| | | පිටුව |
|---|---|---|
| | පෙරවදන | I |
| | ස්තූතිය | II |
| 1. | හැඳින්වීම | 1 |
| 2. | විවිධ ව්‍යාප්ති අංශයන්හි සංවිධාන සැලැස්ම | 2 |
| 2.1 | පොල් වගා කිරීමේ මණ්ඩලය හා එහි ව්‍යාප්ති සේවය | 2 |
| 2.2 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවය | 3 |
| 2.3 | සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවය | 3 |
| 3. | ඉඩම් භාවිතය හා පලදාව වර්ධනය | 4 |
| 3.1 | සාමාන්‍ය කරුණු | 4 |
| 3.2 | නැවත පැල සිටුවීම | 4 |
| 3.3 | පොහොර භාවිතය | 5 |
| 3.4 | අතුරු බෝග වගාව | 6 |
| 4. | ව්‍යාප්තිය, පුහුණු කිරීම හා සංනිවේදන කටයුතු | 7 |
| 4.1 | ගොවීන් | 7 |
| 4.1.1 | නොයෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් සමඟ ගොවීන්ගේ සම්බන්ධතාවය | 7 |
| 4.1.2 | ගොවීන්ගේ ආරංචි මාර්ග | 7 |
| 4.1.3 | ණය පිළිබඳව ගොවීන් තොරතුරු ලබා ගැනීම | 8 |
| 4.1.4 | ග්‍රාමීය ආයතන සමඟ ගොවීන්ගේ සම්බන්ධතාවය | 8 |
| 4.1.5 | කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ චාරිකා හා ක්ෂේත්‍ර දිනයන් | 10 |
| 4.1.6 | ගොවි පුහුණුව | 11 |
| 4.1.7 | සංනිවේදන | 11 |
| 4.2 | ව්‍යාප්ති සේවකයෝ | 13 |
| 4.2.1 | පෞද්ගලික ලක්ෂණ | 13 |
| 4.2.2 | රාජකාරී කටයුතු සඳහා ගත කල කාලය | 15 |
| 4.2.3 | මෙහෙයුම් ක්ෂේත්‍ර | 15 |
| 4.2.4 | අනිකුත් ආයතන සමඟ සම්බන්ධතාවය | 16 |
| 4.2.5 | නිලධාරීන් අතර සම්බන්ධතාවය | 19 |
| 4.2.6 | පර්යේෂණ හා පුහුණුකිරීම | 23 |
| 4.2.7 | සංනිවේදනය | 26 |
| 5. | නිගමන | 27 |
| 6. | නිර්දේශ | 31 |

## සටහන් ලේඛනය


| සටහන් | | පිටුව |
|---|---|---|
| 1 | අක්කර ප්‍රමාණය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 4 |
| 2 | නැවත පැල සිටුවීම කරන ලද අවුරුදු 40 කට වඩා වයසැති පැල සහිත ඉඩම් හිමි ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 4 |
| 3 | පොහොර භාවිතය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 5 |
| 4 | උපදෙස් ලැබූ මාර්ග අනුව පොහොර භාවිතා කළ ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 6 |
| 5 | නොයෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් සමඟ ඇති සම්බන්ධතාවය මත ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 7 |
| 6 | කෘෂිකාර්මික ගැටළු පිළිබඳ අදහස් ලබා ගැනීමට මුලින්ම යන නිලධාරීන් මත ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 8 |
| 7 | කෘෂිසේවා මධ්‍යස්ථානය හෝ ව්‍යාප්ති මධ්‍යස්ථානය පිහිටා තිබෙන ස්ථාන පිළිබඳ දැනුම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 8 |
| 8 | 1973/74 කාලය තුළ කෘෂිසේවා මධ්‍යස්ථානය හෝ ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත පැමිණි වාර ගණන අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 9 |
| 9 | කෘෂිසේවා මධ්‍යස්ථාන හා ව්‍යාප්ති මධ්‍යස්ථානවලට යෑමේ හේතූන් අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 9 |
| 10 | තරුණ ගොවි සමාජ පිළිබඳ දැනීම මත ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 10 |
| 11 | පසුගිය කන්නය තුළ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ නිවසට හෝ කාර්යාලයට යෑමේ ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 10 |
| 12 | ගොවි පුහුණු පන්තිවලට සහභාගී නොවීමට දැක්වූ හේතූ අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 11 |
| 13 | නොමිලේ චිත්‍රපටි දර්ශන නැරඹූ ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 12 |
| 14 | කෘෂිකාර්මික සඟරා කියවන ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 13 |
| 15 | උපදෙස් පත්‍රිකා භාවිතා නොකිරීමට දක්වා ඇති හේතූන් මත ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 13 |

| සටහන් | | පිටුව |
|---|---|---|
| 16 | අධ්‍යාපන සුදුසුකම් අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 14 |
| 17 | වයස අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 14 |
| 18 | කාර්යාලයේ ගත කළ කාලය අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 15 |
| 19 | කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයකුට වෙන් කර ඇති ගොවි පවුල් ගණන හා 1973/74 මහ කන්නයේදී ඔහුට හමු වූ ගොවි පවුල්වල ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 16 |
| 20 | කෘෂිකර්ම පලදාව වර්ධන කමිටුවල හා ගොවි කාරක සභාවල කාර්යයන් පිළිබඳ දැනීම අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 17 |
| 21 | කෘෂිකර්ම පලදාව වර්ධන කමිටුවල වැඩ සම්බන්ධව ඔවුන්ගේ කාර්ය අනුව කෘෂිකර්ම උපදේශක වරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 17 |
| 22 | ශිල්පීය කරුණු පිළිබඳව සමුපකාර කළමනාකරුවන්ගෙන් ඉල්ලීම් ලැබී ඇති කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සහ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 18 |
| 23 | බැංකු ණය පිළිබඳ ගොවීන්ගේ ඉල්ලුම්පත් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 18 |
| 24 | පොල් සංවර්ධන නිලධාරීන් හමු වීම පිළිබඳව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 19 |
| 25 | පොල් වගාව පිළිබඳව තොරතුරු සඳහා ගොවීන් විසින් කරන ලද ඉල්ලීම අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 19 |
| 26 | පොල් සංවර්ධන නිලධාරීන් හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන් හමුවීම පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය–ප්‍රතිශතයක් ලෙස | 20 |
| 27 | පොල් සංවර්ධන නිලධාරීන්ගේ ක්ෂේත්‍ර ගමන්වලට වර්තමාන සහභාගිත්වය අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 20 |
| 28 | පොල් සංවර්ධන නිලධාරීන්ගේ හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ගේ කටයුතු පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ දැනුමේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 21 |

| සටහන් | | පිටුව |
|---|---|---|
| 29 | පොල් සංවර්ධන නිලධාරීන් හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන් සමඟ කෘෂිකර්ම උපදේශකවරු තම වැඩ කටයුතු සම්බන්ධීකරණය කර ඇති අන්දමේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 21 |
| 30 | පොල් සංවර්ධන නිලධාරීන් හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ගේ කාර්යයන් කෘෂිකර්ම උපදේශකවරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් මගින් සම්බන්ධීකරණය කළ යුතුය යන අදහස අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 22 |
| 31 | කෘෂිකර්ම ගුරුවරුන් හමුවීම හා ව්‍යාප්ති කටයුතුවලට සහභාගී වීමට ඔහුට ආරාධනා කිරීම අනුව කෘෂිකර්ම උපදේශකවරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 23 |
| 32 | කරගෙන යනු ලැබෙන පර්යේෂණ වැඩසටහන් පිළිබඳව දැනුම අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 23 |
| 33 | ක්ෂේත්‍ර ගැටළු සඳහා ලැබුණ පර්යේෂණ තොරතුරුවල ඇති අදාළ බව මත කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 24 |
| 34 | පුහුණු පංතිවලට සහභාගී වීම අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 24 |
| 35 | සිය වැඩකටයුතු කිරීමේදී සේවා සංස්කරණ අභ්‍යාස මාලා උපකාර වූ අන්දම අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 25 |
| 36 | අනාගත පුහුණුකිරීම් දියුණු කිරීමට ඉදිරිපත් කළ යෝජනා අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස | 25 |

II වැනි පන්තියේ පොල් ඉඩම් ප්‍රදේශයෙන් තෝරා ගන්නා ලද ගම් හයක් පිළිබඳව විශේෂ අවධානය ඇතිව කොළඹ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ව්‍යාප්තිය, පුහුණුකිරීම හා සන්නිවේදන පිළිබඳ අධ්‍යයනය

## 1. හැඳින්වීම

කෘෂිකාර්මික ව්‍යාප්තිය, පුහුණුකිරීම හා සන්නිවේදනය පිළිබඳ මෙම අධ්‍යයනය, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් ආරම්භ කරන ලද දෙවැනි පන්තියේ පොල් ඉඩම් පිළිබඳව වූ අධ්‍යයනයේ 1/ කොටසකි. පොල් ඉඩම් පිළිබඳ අධ්‍යයනය ආරම්භ කරන ලද්දේ –

* ප්‍රදේශයේ වර්තමාන ඉඩම් භාවිතය, පලදායීතාවය හා සේවා නියුක්තිය සොයා බැලීමට;

* ගම්වල ඇති සම්පත් දියුණු කිරීමෙන් හෝ වෙනත් විකල්ප මාර්ග වලින් පලදායීතාවය වැඩි කිරීමේ හා සේවා නියුක්තිය වැඩි කිරීමේ හැකියාවන් සොයා බැලීමට හා

* ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම වෙත පැවරුන ඉඩම්, පොල් ප්‍රදේශයේ ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීමට උපයෝගී කර ගැනීමේ හැකියාව ඇගැයීමටත්ය.

කෘෂිකාර්මික ව්‍යාප්තියේ ප්‍රාථමික වගකීම, ගැමි ජනතාවගේ ගොවිතැන් ක්‍රමවල තත්වය දියුණු කිරීමටත්, නිෂ්පාදන කාර්යක්ෂමතාවය හා ආදායම වැඩි කිරීමටත් උපකාර කිරීමෙන් ඔවුන්ගේ ජීවන තත්වය නගාලීම නිසා දිස්ත්‍රික්කයේ නොයෙකුත් ව්‍යාප්ති ආයතනවල කටයුතු පිළිබඳව කරනු ලබන මෙම අධ්‍යයනය පහත සඳහන් අරමුණු පරමාර්ථ කොටගෙන ඇත:

(අ) කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා නොයෙකුත් ආයතනවල ව්‍යාප්ති සේවකයින් විසින් භාවිතා කරන ව්‍යාප්ති ක්‍රම, පුහුණුකිරීමේ ක්‍රම හා සන්නිවේදන ක්‍රමවල තුලනාත්මක සපලතාවය පරීක්ෂා කිරීම;

(ආ) ප්‍රදේශයේ ක්‍රියා කරන නොයෙකුත් ග්‍රාමීය ආයතනවල නිලධාරීන්, ව්‍යාප්ති සේවකයින් හා ගොවීන් අතර ඇති ක්‍රියාත්මක සම්බන්ධතාවය නිගමනය කිරීම; සහ

(ඇ) ව්‍යාප්ති සේවකයින්ගේ සේවා සංස්කරණ පුහුණුකිරීම්වල තුලනාත්මක සපලතාවය පරීක්ෂා කිරීම සහ ව්‍යාප්ති සේවකයින් හා ගොවීන්ගේ පුහුණු අවශ්‍යතා තත්සේරු කර ගැනීම.

---

1/ කොළඹ දිස්ත්‍රික්කයේ II වෙනි පන්තියේ පොල් ඉඩම් – ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ අධ්‍යයන මාලා අංක 14

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික උපදේශකවරුන් 18 දෙනෙකුගෙන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් 1/ 60 දෙනෙකුගෙන්ද, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් 3 දෙනෙකුගෙන්ද, පොල් වගා කිරීමේ මණ්ඩලයේ පොල් සංවර්ධන නිලධාරීන් 8 දෙනෙකුගෙන්ද දත්ත ලබා ගන්නා ලදී. ගොවීන් පිළිබඳ දත්ත පහත සඳහන් ගම්වල ගෘහ මූලිකයින් 319 දෙනෙකුගෙන් යුත් සසම්භාවී නියැදියකින් ලබා ගන්නා ලදී: හුඹුටියාව, අම්බන, තැන්නගම, උල්ලලපොල, මාබොදල හා කොරස. අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද්දේ ගොඩ, මඩ අක්කර 1/2 ක් හෝ ඊට වැඩි ක්ෂේත්‍රයක වගා කටයුතු කරනු ලබන ගොවීන්ය. මෙසේ තෝරා ගන්නා ලද්දේ අක්කර 1/2 ට අඩු ඉඩම්වලදී ප්‍රයෝජනවත් කෘෂිකාර්මික පිළිවෙත් මේ ප්‍රදේශයේ භාවිතා වනුයේ ඉතා කලාතුරකින් හෙයිනි. අනතුරුව මෙම පදනම මත 319 කින් යුත් නියැදියෙන් ගොවීන් 117 දෙනෙකු තෝරා සම්මුඛ පරීක්ෂණයට යොමු කරන ලදී. මේ පදනම මතම ඉඩම් භාවිතය හා පලදා වර්ධනය පිළිබඳ අධ්‍යයනය සඳහාද අක්කර 1/2 කට වඩා විශාල පොල් ඉඩම් වගා කළ ගොවීන් 177 න් 134 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට යොමු කරන ලදී.

## 2. විවිධ ව්‍යාප්ති අංශයන්හි සංවිධාන සැලැස්ම

### 2.1 පොල් වගා කිරීමේ මණ්ඩලය හා එහි ව්‍යාප්ති සේවය

පොල් වගා කිරීමේ මණ්ඩලය පිහිටුවන ලද්දේ 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත යටතේය. මෙම පනත මගින් මූලික වශයෙන් පොල් කර්මාන්තයේ සංවර්ධනය හා පාලනය මෙන්ම පොල් වගාවන් සඳහා ඉඩම් භාවිතය සම්බන්ධයෙන්ද විධිවිධාන සැලසේ. පොල් වගාවේ පලදායීතාවය දියුණු කිරීම, පොල් සමග තෘණ ඇතුළු වෙනත් අතුරු බෝග වගා කිරීම හා ඒවාට සහාය දීම සහ පොල් වතුවල සත්ව පාලනය දියුණු කිරීම පොල් වගා කිරීමේ මණ්ඩලයේ වගකීම වේ. ඊට අමතරව පොල් වතුවල පොල් හා අනිකුත් බෝග වගාව සඳහා නිසියාකාර වගා පිළිවෙත් මෙහෙයවා දියුණු කිරීමද මෙම වගකීමට ඇතුළත් වන්නේය.

ඉහත සඳහන් අරමුණුවල සාර්ථකභාවය රඳා පවතින්නේ දිවයින පුරා පැතිර ඇති මණ්ඩලීය ව්‍යාප්ති සේවයට අයත් පොල් සංවර්ධන නිලධාරීන් මතය.

කොළඹ දිස්ත්‍රික්කය තුළ ජ්‍යෙෂ්ඨ පොල් සංවර්ධන නිලධාරීන් දෙදෙනකු යටතේ ප්‍රාදේශීය කාර්යාල දෙකක් ඇත. මෙම නිලධාරීන් යටතේ දිස්ත්‍රික්කයේ නොයෙක් ස්ථානවල කටයුතු කරන පොල් සංවර්ධන නිලධාරීන් 18 දෙනෙක් සිටී. මෙයින් පස් දෙනෙකු සමීක්ෂණය සඳහා තෝරා ගනු ලැබූ දෙවැනි පංතියේ පොල් ඉඩම් ප්‍රදේශයෙහි සේවය කරති.

---

1/ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයින්.

සෑම පොල් සංවර්ධන නිලධාරියෙකුගේම මෙහෙයුම් ක්ෂේත්‍රයට, කෘෂිකර්ම පලදාව වර්ධන කමිටු බල ප්‍රදේශ [1] එකක්, දෙකක් හෝ සමහර අවස්ථාවලදී තුනක් අඩංගු වේ. සාමාන්‍යයෙන් ග්‍රාමීය මට්ටමෙන් සහායකයින් නොමැති වුවත්, මීගමුව කාර්යාලයට අනුයුක්තව ක්ෂේත්‍ර සහායකයින් දෙදෙනෙකු ඇති අතර ඔවුන්ගේ සේවාවන් අවශ්‍ය වූ විට පොල් සංවර්ධන නිලධාරීන්ට ලබාගත හැක. ඔවුන්ගේ සහාය සාමාන්‍යයෙන් අවශ්‍ය වන්නේ සමෝච්ච වැටි සළකුනු කිරීම, කුඤ්ඤ ගැසීම හා පැල සිටුවීමේ වලවල් ලකුණු කිරීම, පොහොර දැමීම පරීක්ෂා කිරීම යනාදිය සඳහාය.

## 2.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවය

දිස්ත්‍රික්කයේ මෙම සංවිධානය දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිගේ ප්‍රධානත්වයෙන් පවතී. ඔහුට උපකාර කිරීම සඳහා මූලස්ථාන කෘෂිකර්ම උපදේශකවරයෙක් හා වී පැළෑටි සංරක්ෂණය, උද්‍යාන විද්‍යාව හා තරුණ ගොවි සමාජ කටයුතු ආදී විෂයයන් පිළිබඳ විශේෂඥ නිලධාරීන් පිරිසක්ද ඇත. දිස්ත්‍රික්කයේ නොයෙකුත් ස්ථානවල කෘෂිකර්ම උපදේශකවරුන් 18 දෙනෙක් සිටින අතර එයින් 5 දෙනෙකු II වෙනි පංතියේ පොල් ඉඩම් ප්‍රදේශයේ සේවය කරති. මොවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ කාර්යාල අලුතින් ඇති කරන ලද කෘෂිකර්ම පලදාව වර්ධන කමිටුවල ඇති අතර ඇතැමෙක් තවමත් කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානවල සිට කටයුතු කරයි. මෙම කෘෂිකර්ම උපදේශකවරුන් යටතේ ග්‍රාමීය මට්ටමේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් 60 දෙනෙක් සේවය කරති.

## 2.3 සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවය

මෙම දෙපාර්තමේන්තුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ 1971 සැප්තැම්බර් මාසයේදී පිහිටුවන ලදී. දෙපාර්තමේන්තුව සතු වගකීම වනුයේ, කුරුඳු, කරාබු, සාදික්කා, කෝපි, ගම්මිරිස් වැනි සම්ප්‍රදායික නොවන සුළු අපනයන බෝග සංවර්ධනය සඳහා පර්යේෂණ හා ව්‍යාප්ති කාර්යයන් ඉටු කිරීමයි. මෙම බෝග වැවීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රදේශයන්හි ව්‍යාප්ති සේවය, දෙපාර්තමේන්තුව මගින් ක්‍රමයෙන් පුළුල් කරගෙන යනු ලැබේ. කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන කාර්යාලයට සම්බන්ධව දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරියකුද, කොළඹ දකුණු හා උතුරු ප්‍රදේශවල සේවය සඳහා ක්ෂේත්‍රයේ ව්‍යාප්ති නිලධාරීන් දෙදෙනෙකුද සිටී.

---

1/ කෘෂිකර්ම පලදාව වර්ධන කමිටුව – කෘෂිකර්ම හා ඉඩම් ඇමති විසින් පත් කරනු ලැබූ කමිටුවකි. මෙහි වගකීම් වනුයේ එම කමිටුවට අයත් වන ප්‍රදේශයේ කෘෂිකර්මය දියුණු කිරීම, සම්බන්ධීකරණය හා සංවර්ධනය කිරීමත්ය.

## 3. ඉඩම් භාවිතය හා පලදාව වර්ධනය

### 3.1 සාමාන්‍ය කරුණු

මෙම ප්‍රදේශයේ දේශගුණික මෙන්ම අනිකුත් සාධකද අනුව අවුරුද්ද මුළුල්ලේම පාහේ සුක්ෂම ලෙස ගොවිතැන් කිරීමට ප්‍රදේශය යෝග්‍ය වුවත් ප්‍රදේශයේ ඉඩම් සම්පූර්ණ වශයෙන් සංවර්ධනය සඳහා උපයෝගී කරගෙන නොමැත. ප්‍රදේශයේ බොහෝ ස්ථානයන්හි ගොඩ ඉඩම්වල මූලික වශයෙන් පොල් වගා කර ඇති අතර අක්කර 3 ත් හා ඊට වඩා විශාල ඉඩම්වල පොල් තනිකර වගා කර තිබේ. කුඩා ඉඩම් බොහොමයක් ගෙවතු වන අතර ඒවා මිශ්‍ර වගා වලින් යුක්තය. අක්‍රමවත් ලෙස පොල් වගා කර ඇති ඉඩම්වල සාමාන්‍යයෙන් මයියොක්කා, අල වර්ග, කෙසෙල්, බුලත් වැනි බෝග අතුරු බෝග ලෙස අක්‍රමානුකූලව වගා කර ඇත. අක්කර 3 ට වඩා විශාල ඉඩම් ගොවීන්ගෙන් 25% කට අයිති වේ. පළමුවැනි සටහනේ අක්කර ප්‍රමාණය අනුව ඉඩම් හිමිකමේ ව්‍යාප්තිය පෙන්වා ඇත.

සටහන 1 අක්කර ප්‍රමාණය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N = 134)

| අක්කර ප්‍රමාණය | ගණන | % |
|---|---|---|
| අක්කර 1 ට අඩු | 32 | 24 |
| 1 – 2.9 | 67 | 50 |
| 3 – 4.9 | 18 | 13 |
| 5 – 6.9 | 10 | 8 |
| අක්කර 7 ට වැඩි | 7 | 5 |
| මුළු ගණන | 134 | 100 |

### 3.2 නැවත පැල සිටුවීම

පොල් ඉඩම් වලින් අඛණ්ඩ ආදායමක් ලබා ගැනීම සඳහා පැරණි වගාව වයසට පත්වන විට ක්‍රමානුකූලව නැවත පැල සිටුවීම කළ යුතුයි. පැරණි පොල් ගස් තම ඉඩම්වල තිබූ ගොවීන්ගෙන් 61% ක් නැවත පැල සිටුවීම හෝ හිස්තැන් පිරවීම සිදු කළහ.

සටහන 2 නැවත පැල සිටුවීම කරන ලද අවුරුදු 40 කට වඩා වයසැති පැල සහිත ඉඩම් හිමි ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N = 89)

| | ගණන | % |
|---|---|---|
| නැවත පැල සිටවූ | 42 | 47 |
| හිස්තැන් පිරවීම | 12 | 14 |
| නැවත පැල නොසිටවූ | 35 | 39 |
| මුළු ගණන | 89 | 100 |

නැවත පැල නොසිටවූ ගොවීන් 35 දෙනාගෙන් 74%ක් නැවත පැල සිටුවීම වැදගත් දෙයක් ලෙස නොසිතූ අතර, 9% ක් එසේ කිරීමටඅවශ්‍ය ප්‍රාග්ධනය නොමැත්තවුන් වූහ. නැවත පැල සිටවූ 54 දෙනාගෙන් 85% ක් තමන්ගේම පැල භාවිතා කළ අතර 9% ක් පොල් පර්යේෂණ ආයතනයේ පැල භාවිතා කළහ.

මෙම අධ්‍යයනයෙන් පෙනුන කරුණක් නම් තෝරා ගත් පොල් පැල බෙදා හැරීම කෙළින්ම පොල් පර්යේෂණ මණ්ඩලය මගින් කරන ලද අතර, පොල් පැල ලබා ගත්තේ කවුරුන් විසින්දැයි පොල් සංවර්ධන නිලධාරීන් දැන නොසිටි බවය. ඒ හේතුවෙන් පැල ලබා ගත් අයට ශිල්පීය තොරතුරු ලබා දීමට නොහැකි තත්වයක ඔව්හු සිටියහ. එසේම නැවත පැල සිටවූ අයගෙන් 8% ක් පමණක්, සිටුවීම සඳහා වලවල් පිළියෙල කිරීම පොල් පර්යේෂණ මණ්ඩලයේ නිර්දේශයන් අනුව කළ අතර, 80% ක් දෙනා ඔවුන්ගේ හිතූ මනාපයට එය කළ බව අධ්‍යයනයෙන් හෙළිදරව් විනි.

### 3.3 පොහොර භාවිතය

නොයෙකුත් පොල් වගා කරන ප්‍රදේශවල විවිධ පස් වර්ගයන් උදෙසා පොල් පර්යේෂණ මණ්ඩලය නිර්දේශ කර ඇති පොහොර මිශ්‍රණ භාවිතා කිරීම උපරිම පොල් නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා ඉතා වැදගත්ය. මෙම අධ්‍යයනයෙන් පෙනී ගිය කරුණක් නම් ගොවීන්ගෙන් 52% ක් කිසිවිටක තම පොල් වගාවන්ට පොහොර යොදා නැති බවයි.

සටහන 3 පොහොර භාවිතය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශයත් ලෙස (N = 134)

| | අංකය | % |
|---|---|---|
| පොහොර භාවිතා නොකර | 70 | 52 |
| 1974 භාවිතා කළ | 23 | 17 |
| 1973 භාවිතා කළ | 3 | 2 |
| 1972 භාවිතා කළ | 12 | 9 |
| 1971 භාවිතා කළ | 10 | 9 |
| 1970 ට පෙර භාවිතා කළ | 16 | 11 |
| මුළු ගණන | 134 | 100 |

ගොවීන් 59% ක් වාර්තා කළ අන්දමට පොහොර භාවිතා නොකිරීමට ප්‍රධාන හේතුව වූයේ මුදල් හිඟකමයි. 26% ක් කියා සිටියේ ලබා ගැනීමට පොහොර නොමැති බවය.

ගොවීන්ගෙන් 11% දෙනෙක් පොහොර භාවිතය පිළිබඳ උපදෙස් පොල් සංවර්ධන නිලධාරීන්ගෙන් ලබා ගත් අතර 9% ක් දෙනා එම තොරතුරු ලබා ගත්තේ පොල් පර්යේෂණ

මණ්ඩලයේ පත්‍රිකා මගිනි. 4 වෙනි සටහනේ පෙන්නුම් කරන පරිදි 73% ක් කිසිත් උපදෙස් ලබා නොසිටියහ.

සටහන 4 උපදෙස් ලැබූ මාර්ග අනුව පොහොර භාවිතා කළ ගොවීන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 64)

| | ගණන | % |
|---|---|---|
| පොල් සංවර්ධන නිලධාරී | 7 | 11 |
| කෘෂිකර්ම උපදේශකවරු | 1 | 2 |
| කෘෂිකර්ම ව්‍යාප්ති සේවක | 0 | - |
| පොල් පර්යේෂණ මණ්ඩලයේ පත්‍රිකා | 6 | 9 |
| අසල්වැසියන් | 3 | 5 |
| තොරතුරු නොලැබුවන් | 47 | 73 |
| මුළු ගණන | 64 | 100 |

### 3.4 අතුරු බෝග වගාව

නොයෙකුත් කෙටිකාලීන මුදල් හා ආහාර බෝග පොල් සමඟ අතුරු බෝගයක් ලෙස වගා කිරීමෙන් නිෂ්පාදනය වැඩි වන අතර ගොවීන්ගේ ආදායමද වැඩි කිරීමට උපකාර වේ.

මෙම අධ්‍යයනයෙන් පෙනී ගිය කරුණක් නම් ගොවීන්ගෙන් 69% ක් අතුරු බෝග වගා කළ බවයි. අතුරු බෝග වගා නොකල 31% දෙනා, ඒ පිළිබඳ හේතූන් කිහිපයක් ගෙන හැර දැක්වූහ. මෙයින් ප්‍රධාන කරුණ වූයේ ඉඩකඩ මදි කමයි. ඉඩම්වල සෙවන තිබීම හා තොරතුරුවල හිඟකම සඳහන් කරන ලද අනිකුත් හේතූන් විය. ජනප්‍රියම අතුරු බෝගය වූයේ මයියොක්කාය. දෙවන තැන කෙසෙල්වලට ලැබුන අතර බතල, ගුරු, කහ හා බුලත්ද වගා කරන ලදී. ගොවීන්ගෙන් අඩක් පමණ දෙනා තම අතුරු බෝගවලට කෘතිම පොහොර හෝ ඓන්ද්‍රීය පොහොර යෙදූහ.

දෙවන පංතියේ පොල් ඉඩම්, දියුණු කළ තෘණ වගා කර සත්ව පාලනය දියුණු කිරීම සඳහා බෙහෙවින්ම යෝග්‍ය වුවත්, අධ්‍යයනයෙන් පෙනී ගියේ මෙම කාර්යය නගාලීම සඳහා ප්‍රයත්නයක් ගෙන නැති බවය. දියුණු තෘණ වර්ග පොල් වගාවන් යට වවා තිබුනේ ගොවීන්ගෙන් 4% ක් පමණකි.

## 4. ව්‍යාප්තිය, පුහුණු කිරීම හා සංනිවේදන කටයුතු

### 4.1 ගොවීන්

#### 4.1.1 නොයෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් සමඟ ගොවීන්ගේ සම්බන්ධතාවය

ගොවීන්ගෙන් විශාල සංඛ්‍යාවක් වැඩි වශයෙන් සමුපකාරයේ කළමනාකරු දැන හැඳින සිටි අතර, 59% ක් දෙනා ගොවි කාරක සභාවේ සභාපති ගැන දැන සිටියහ. ඊළඟට 46% ක් දෙනා කෘෂිකර්ම ව්‍යාප්ති සේවක ගැන හඳුනාගෙන සිටියහ.

සටහන 5 නොයෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් සමඟ ඇති සම්බන්ධතාවය මත ගොවීන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N= 177)

| | අංකය | % |
|---|---|---|
| කෘෂිකර්ම උපදේශක | 22 | 12 |
| කෘෂිකර්ම ව්‍යාප්ති සේවක | 81 | 46 |
| පශු වෛද්‍ය | 14 | 8 |
| පොල් සංවර්ධන නිලධාරී | 21 | 12 |
| සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරී | 4 | 3 |
| ග්‍රාමීය වගා නිලධාරී | 5 | 3 |
| ගොවි කාරක සභා සභාපති | 104 | 59 |
| සමුපකාර කළමනාකරු | 131 | 74 |
| ප්‍රාදේශීය නිලධාරී | 7 | 5 |

16% ක් ගොවීන්, ඇතැම් ශිල්පීය උපදෙසක් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකගෙන් ලැබූ බව පැවසූ අතර 22% ක් ගොවීන් සමුපකාර කළමනාකරුගෙන් ද්‍රව්‍යමය යෙදවුම් ලබා ගත්හ. ඉතිරි ගොවීන් 5 වැනි සටහනේ සඳහන් කල අයගෙන් කිසිවකුගෙන් උපදෙස් හා ද්‍රව්‍යමය යෙදවුම් ලබා නොසිටියහ.

#### 4.1.2 ගොවීන්ගේ ආරංචි මාර්ග

ගොවීන්ගෙන් 59% ක් තම කෘෂිකාර්මික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තම සහෝදර ගොවීන් වෙත එළඹෙන බව හා 11% ක් පමණක් මේ සඳහා කෘෂිකර්ම උපදේශක වෙතත් 10% ක් කෘෂිකර්ම ව්‍යාප්ති සේවක වෙතත් පැමිණෙන බව 6 වෙනි සටහනෙන් අනාවරණය වේ.

සටහන 6 කෘෂිකාර්මික ගැටළු පිළිබඳ අදහස් ලබා ගැනීමට මුලින්ම යන නිලධාරීන් මත ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N= 126)

| නිලධාරීන් | අංකය | % |
|---|---|---|
| කෘෂිකර්ම ව්‍යාප්ති සේවක | 13 | 10 |
| කෘෂිකර්ම උපදේශක | 14 | 11 |
| අනෙකුත් ගොවීන් | 74 | 59 |
| සමූපකාර කළමනාකරුවන් | – | – |
| අනෙකුත් නිලධාරීන් | 25 | 20 |
| මුළු ගණන | 126 | 100 |
| ප්‍රතිචාරයක් නොමැති | 51 | |

නිලධාරීන් හමු වීමට වඩා තම සහෝදර ගොවීන් හමු වීම පහසු බව ගොවීන්ගේ අදහසයි.

### 4.1.3 ණය පිළිබඳව ගොවීන් තොරතුරු ලබා ගැනීම

ගොවීන්ගෙන් 73% ක් ණය පිළිබඳව කිසිවකුගෙන් තොරතුරු විමසා නැත. 25% ක් මෙම තොරතුරු ලබා ගත්තේ කෘෂිකර්ම උපදේශකගෙන් හෝ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකගෙනි.

### 4.1.4 ග්‍රාමීය ආයතන සමග ගොවීන්ගේ සම්බන්ධතාවය

(අ) <u>කෘෂිසේවා මධ්‍යස්ථාන හා ව්‍යාප්ති මධ්‍යස්ථාන:</u>

පහත 7 වැනි සටහන අනුව පෙනී යන්නේ ගොවීන්ගෙන් 48% දෙනෙක් පමණක් කෘෂිසේවා මධ්‍යස්ථානය හෝ ව්‍යාප්ති මධ්‍යස්ථානය පිහිටා තිබූ ස්ථානය දැනගෙන සිටි බවය. ගොවීන්ගෙන් වැඩි දෙනෙක් (78%) කිසිවිටක මෙම මධ්‍යස්ථානවලට පසුගිය වර්ෂය තුළ පැමිණ නැත. ඉතිරි ගොවීන් 8 වැනි සටහනේ දක්වා ඇති පරිදි මෙම ස්ථානවලට ගොස් ඇත.

සටහන 7 කෘෂිසේවා මධ්‍යස්ථානය හෝ ව්‍යාප්ති මධ්‍යස්ථානය පිහිටා තිබෙන ස්ථාන පිළිබඳ දැනුම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස ( N = 177)

| | අංකය | % |
|---|---|---|
| දනී | 85 | 48 |
| නොදනී | 92 | 52 |
| මුළු ගණන | 177 | 100 |

සටහන 8 1973/74 කාලය තුළ කෘෂිසේවා මධ්‍යස්ථානය හෝ ව්‍යාපෘති මධ්‍යස්ථානය වෙත පැමිණි වාර ගණන අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N=177)

| වාර ගණන | ගණන | % |
|---|---|---|
| පැමිණ නැත | 134 | 76 |
| වාර 1 - 3 | 34 | 19 |
| වාර 4 - 6 | 6 | 3 |
| වාර 6 ට වැඩි | 3 | 2 |
| මුළු ගණන | 177 | 100 |

මෙම ගමන්වලට ප්‍රධාන හේතුව වූයේ බීජ, පැල වර්ග, පලිබෝධක හා පොහොර ලබා ගැනීමයි (සටහන 9).

සටහන 9 කෘෂිසේවා මධ්‍යස්ථාන හා ව්‍යාපෘති මධ්‍යස්ථානවලට යෑමේ හේතූන් අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 43)

| හේතුව | ගණන | % |
|---|---|---|
| යෙදවුම් සඳහා | 23 | 53 |
| උපදෙස් සඳහා | 12 | 28 |
| ඉඩම් ආරවුල් | 8 | 19 |
| මුළු ගණන | 43 | 100 |

(ආ) <u>අනිකුත් ග්‍රාමීය ආයතන:</u>

ගොවීන්ට වැදගත් හා ප්‍රයෝජනවත් යයි සැලකෙන අන්දමට ඔවුන් විසින් නම් කරන ලද නොයෙකුත් ග්‍රාමීය ආයතන අනුපිළිවෙලට පහත සඳහන් වේ.

1. මරණාධාර සමිතිය
2. ග්‍රාම සංවර්ධන සමිතිය
3. ගොවි කාරක සභාව
4. සමූපකාර සමිතිය
5. කාන්තා සමිති
6. තරුණ ගොවි සමාජය

(ඇ) <u>තරුණ ගොවි සමාජ:</u>

ගොවීන්ගෙන් 14% දෙනා ප්‍රදේශයේ තරුණ ගොවි සමාජ තිබෙන බව දැනගෙන සිටියහ. ගොවීන්ගෙන් 57% දෙනෙකුට තරුණ ගොවි සමාජ නොතිබුණ අතර 29% දෙනෙකු ඒවා තිබෙන බව නොදැන සිටියහ (සටහන 10). තරුණ ගොවි සමාජ පිළිබඳව දැනගෙන සිටි ගොවීන් 15% දෙනා අතුරින් 44% දෙනෙකුගේ දරුවෝ මෙම සමාජවල සාමාජිකයෝ වූහ.

ගොවීන් වැඩි දෙනෙක් විසින් පවසන ලද්දේ මෙම සමාජ ඔවුන්ට වී වගා කිරීම, මාර්ග හා ගොඩනැගිලි තැනීමේ ආදියේදී ශ්‍රමදාන වැඩකටයුතුවලට උපකාර වූ බවයි.

සටහන 10     තරුණ ගොවි සමාජ පිළිබඳ දැනීම මත ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N=177)

| | ගණන | % |
|---|---|---|
| දැන සිටි | 25 | 14 |
| සමාජ නොමැත | 100 | 57 |
| නොදැන සිටියහ | 52 | 29 |
| මුළු ගණන | 177 | 100 |

මෙම තරුණ ගොවි සමාජවල තත්වය දියුණු කිරීම සඳහා ගොවීන් ඉදිරිපත් කළ සමහර යෝජනා වූයේ, රජය විසින් මෙම සමාජවලට ඉඩම් ලබා දිය යුතු බව හා ගොවි සමාජ කටයුතු පිළිබඳව තරුණ ගොවීන් වැඩිහිටියන්ගෙන් මීට වඩා උපදෙස් ලබා ගත යුතු බවත්ය.

### 4.1.5 කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ චාරිකා හා ක්ෂේත්‍ර දිනයන්

පහත 11 වැනි සටහනට අනුව පසුගිය කන්නයේදී ගොවීන්ගෙන් 91% ක් මොනයම් හේතුවකටවත් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකගේ නිවසට හෝ කාර්යාලයට ගොස් නැත.

සටහන 11     පසුගිය කන්නය තුළ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ නිවසට හෝ කාර්යාලයට යෑමේ ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N= 177)

| වාර ගණන | ගණන | % |
|---|---|---|
| කිසි දිනක ගොස් නැත | 161 | 91 |
| එක් වරක් | 11 | 6 |
| වාර 2 – 3 | 1 | 1 |
| වාර 4 – 5 | 2 | 1 |
| වාර 5 ට වැඩි | 2 | 1 |
| මුළු ගණන | 177 | 100 |

ගොවීන්ගෙන් වැඩි දෙනෙකු ව්‍යාප්ති සේවකයින් විසින් සංවිධානය කරන ලද ක්ෂේත්‍ර දිනයන්ට සහභාගී නොවූහ. මෙසේ සහභාගී නොවීමට ප්‍රධාන හේතුව වූයේ ගොවීන්ගෙන් 97% ක් මෙම ක්ෂේත්‍ර දිනයන් පිළිබඳව නොදැන සිටීමයි. එවැනි ක්ෂේත්‍ර දිනයන්ට සහභාගී වූ ගොවීන් 8 දෙනාගෙන් 7 දෙනෙකු පැවසුවේ ඔවුන් ක්ෂේත්‍ර දිනවලට සහභාගීවීමෙන් කිසියම් අළුත් දෙයක් ඉගෙන ගත් බවය. එයින්ද 5 දෙනෙකු ඔවුන් ඉගෙන ගත් දේ සාර්ථක ලෙස ක්‍රියාවට යොදා ඇත.

### 4.1.6 ගොවි පුහුණුව

මෙම අධ්‍යයනයට අදාළ ගොවීන් 177 දෙනාගෙන් 6 දෙනෙකු පමණක් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් විසින් පවත්වන ලද පුහුණුකිරීමේ පංතිවලට සහභාගී වී ඇත. එසේම ඔවුන් කිසිවෙක් වෙනත් කවර වූ හෝ නිලධාරීන් විසින් පවත්වනු ලැබෙන පුහුණු පංති පිළිබඳව නොදැන සිටියහ. 12 වැනි සටහනේ දැක්වෙන පරිදි පුහුණු පංතිවලට සහභාගී නොවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඔවුන් මේවා පිළිබඳව දැන නොසිටීමයි.

සටහන 12 ගොවි පුහුණු පංතිවලට සහභාගී නොවීමට දැක්වූ හේතු අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස

| හේතු | ගණන | % |
|---|---|---|
| පංති පිළිබඳව නොදැනීම | 132 | 77 |
| කාර්ය බහුල නිසා ඒමට නොහැකි වීම | 8 | 5 |
| පැමිණීමට දුර නිසා | 3 | 1 |
| සැළකිල්ලක් නොදැක්වීම | - | - |
| අනිකුත් හේතූන් | 28 | 17 |
| මුළු ගණන | 171 | 100 |

මෙම පංතිවලට සහභාගී වූ බොහෝ දෙනෙකු තම යහළුවන්ට හා අසල්වැසියන්ටද ඒවාට සහභාගී වන ලෙස උපදෙස් දුන්හ. මෙම පංති පැවැත්විය යුතු ස්ථානය ගැන ගොවීන් ගෙන් විමසූ විට, ඒ පිළිබඳව තම අදහස් පළ කළ ගොවීන් 56 දෙනාගෙන් 52% ක් පැවසුවේ ඔවුන්ගේ නිවෙස්වලට ආසන්න පාසැල්වල හෝ වෙනත් ආයතනවල එම පංති පැවැත්විය යුතු බවයි. තුනෙන් එකක් පමණ (30%) පුහුණුකිරීමේ පංති ක්ෂේත්‍රයේ පැවැත්වීමටත් 18% ක් එම පංති කෘෂිසේවා මධ්‍යස්ථානවල පැවැත්වීමටත් කැමැත්තක් දැක්වීය.

### 4.1.7 සංනිවේදන

(අ) <u>ගුවන්විදුලි ගොවි වැඩසටහන්:</u> අධ්‍යයනයෙන් පෙනී ගියේ අඩක් පමණ ගොවීන් මෙම වැඩසටහන්වලට සවන් දුන් බවයි. සවන් නොදුන් අයගෙන් 85% ක් පැවසුවේ ඔවුන්ට

ගුවන්විදුලි යන්ත්‍ර නැති බවය. 12% ක් පැවසුවේ මෙම වැඩසටහන් එතරම් සිත් ඇද ගන්නා සුළු නොවන බවය. ඒවා පවත්වන වේලාවන් සුදුසු නොවන බව 3% ක් අදහස් කළහ.

(ආ) <u>චිත්‍රපටි දර්ශන</u>: පසුගිය වර්ෂය තුළ ගොවීන්ගෙන් 45% ක් පමණ චිත්‍රපටි දර්ශන නරඹා ඇති බව 13 වෙනි සටහනෙන් පෙනී යයි. 33% ක් කොහෙත්ම චිත්‍රපටි දර්ශන දැක නැත. ඒවා නැරඹූ ගොවීන්ගෙන් වැඩි දෙනෙක් අදහස් කළේ එම චිත්‍රපටි තමන්ගේ වැඩ කටයුතුවලට අදාළ වන බව හා ඒවායෙහි වටිනාකමක් ඇති බවය. වඩාත් චිත්‍රපටි දර්ශන නැරඹීමට ගොවීන්ගෙන් වැඩි දෙනෙක් කැමැත්ත පළ කළ අතර ඒවා නැරඹීම සඳහා ගාස්තුවක් ගෙවීමට වුවද මනාපය දැක්වූහ.

සටහන 13 නොමිලේ චිත්‍රපටි දර්ශන නැරඹූ ගොවීන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N= 177)

| | ගණන | % |
|---|---|---|
| මතක නැත | 41 | 22 |
| ඇතැම් විට නරඹා ඇත | 75 | 45 |
| නරඹා නැත | 61 | 33 |
| මුළු ගණන | 177 | 100 |

(ඇ) <u>කෘෂිකාර්මික සඟරා</u>: 14 වැනි සටහන අනුව ගොවීන්ගෙන් 14% ක් 'ගොවිකම් සඟරාව' කියවා ඇති අතර, 3% ක් පමණක් 'ගොවි ජනතාව' 1/ කියවා ඇත. මෙම සඟරා කියවූ ගොවීන්ගෙන් අඩක් පමණ මෙම සඟරා ඉතා ප්‍රයෝජනවත් බව විස්තර කළ අතර ඒවා තරමක් ප්‍රයෝජනවත් බව ඉතිරි අය ප්‍රකාශ කළහ. ගොවීන් වඩාත් කැමති විෂයයන් ලෙස ප්‍රකාශ කළේ නව වගා පිළිවෙත්, රෝ මැඩීම, හකුරු සෑදීම, ආහාර කල් තබා ගැනීම හා පොහොර හිඟකමට පිළියම් ආදියයි.

---

1/ පිටපත් 25,000 ක් පමණ සාමාන්‍යයෙන් බෙදා හරිනු ලැබෙන 'ගොවිකම් සඟරාව' හා පිටපත් 5,000 ක් පමණ බෙදා හරිනු ලැබෙන 'ගොවි ජනතාව' පිළිවෙලින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබෙන ත්‍රෛමාසික සඟරා වේ.

සටහන 14 කෘෂිකාර්මික සඟරා කියවන ගොවීන්ගේ ව්‍යාප්තිය ප්‍රතිශතයක් ලෙස (N= 177)

| | ගොවිකම් සඟරාව | | ගොවි ජනතා ව | |
|---|---|---|---|---|
| | ගණන | % | ගණන | % |
| කියවා ඇත | 24 | 14 | 5 | 3 |
| කියවා නැත | 153 | 86 | 172 | 97 |
| මුළු ගණන | 177 | 100 | 177 | 100 |

සඟරා නොකියවීමට හේතූන් අතර 53% දෙනෙක් ප්‍රකාශ කළේ සඟරා නැති බවය. 23% දෙනෙකු සඟරා පිළිබඳව නොදන්නා බව පැවසූහ. 4% ක් ප්‍රකාශ කළේ ඒවායේ දක්නට ලැබෙන ලිපි තමන්ගේ ගොවිතැන් කටයුතුවලට අදාළ නොවන බවය

(ඈ) උපදෙස් පත්‍රිකා: උපදෙස් පත්‍රිකා භාවිතා කර තිබුනේ ගොවීන් 31 (18%) ක් පමණි. මේවා නොකියවීමට හේතූන් 15 වැනි සටහනේ දක්වා ඇත.

සටහන 15 උපදෙස් පත්‍රිකා භාවිතා නොකිරීමට දක්වා ඇති හේතූන් මත ගොවීන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N= 146)

| | ගණන | % |
|---|---|---|
| කියවීමට නොහැක | 7 | 5 |
| ඒවා ගැන නොදනී | 70 | 48 |
| ලබා ගැනීමට නැත | 49 | 33 |
| අදාළ නොවේ | 2 | 1 |
| කියවීමට වේලාවක් නැත | 7 | 5 |
| සැළකිල්ලක් දක්වනු නොලැබේ | 11 | 8 |
| මුළු ගණන | 146 | 100 |

4.2 ව්‍යාප්ති සේවකයෝ

4.2.1 පෞද්ගලික ලක්‍ෂණ

(අ) අධ්‍යාපනය: සියළුම කෘෂිකර්ම උපදේශකවරු, පොල් සංවර්ධන නිලධාරීන් හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන් පේරාදෙණියේ කුන්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඩිප්ලෝමා සහතික ලද අය වූහ. මෙය සාමාන්‍ය කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු පාඨමාලාවකි. ඒ කෙසේ වෙතත් නොයෙකුත් දෙපාර්තමේන්තුවල සේවයට බැඳුන පසු ඔවුන්ට ඒ ඒ ක්ෂේත්‍රයන්හි විශේෂත්ව පුහුණුවක් ලබා දී ඇත. වී වගාව, වෙනත් ක්ෂේත්‍ර බෝග, සත්ව පාලනය හා ව්‍යාප්ති ක්‍රම වේදය පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරු පුහුණුවක් ලබා ඇත. මෙම පුහුණුව වැඩි වශයෙන්



පුස්තකාලය
LIBRARY
HARTI
22124

දෙනු ලබන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදීය. ඇතැමෙක් විවිධ විෂයයන් සම්බන්ධයෙන් විදේශයන්හිදී විශේෂත්ව පුහුණුවක් ලබා ඇත. පොල් සංවර්ධන නිලධාරීන් හට පොල් වගාවේ විවිධ අංශ පිළිබඳව පොල් පර්යේෂණ ආයතනයේදී පුහුණුවක් ලබා දී ඇති අතර මෑතකදී ඔවුනට අතුරු බෝග වගාව පිළිබඳ පුහුණුවක් ගන්නෝරුවේ සේවා සංස්කරණ ආයතනයේදී ලබා දී ඇත. සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ටද සුළු අපනයන බෝග වගා කිරීම ගැන විශේෂත්ව පුහුණුවක් ලබා දී ඇත. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් වැඩි දෙනෙකුට (86%) ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පාලනය කරන ප්‍රායෝගික ගොවිපල විද්‍යාල වලින් ප්‍රදානය කල එක් අවුරුදු සහතිකය පමණි. මෑතකදී දෑවුරුදු ඩිප්ලෝමා සහතික ලද්දවුන්ද කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් ලෙස සේවයට බැඳී ඇත. 16 වෙනි සටහනෙහි දැක්වෙන පරිදි කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් 7% කට කෘෂිකර්මය පිළිබඳ කිසිදු පසුබිමක් නොතිබුනි.

සටහන 16 අධ්‍යාපන සුදුසුකම් අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N= 58)

| අධ්‍යාපන සුදුසුකම් | ගණන | % |
|---|---|---|
| දෑවුරුදු ඩිප්ලෝමාව | 4 | 7 |
| එක් අවුරුදු සහතිකය | 50 | 86 |
| අධ්‍යාපන සුදුසුකමක් නැත | 4 | 7 |
| මුළු ගණන | 58 | 100 |
| ප්‍රතිචාරයක් නැත | 2 | |

(ආ) <u>වයස</u>: වයස ගැන සැලකූ විට කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් 48% ක් අවුරුදු 41 ඉක්මවා සිටියහ. 12% පමණක් 17 වැනි සටහනේ ඇති පරිදි අවුරුදු 30 ට අඩු අය වෙති.

සටහන 17 වයස අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස - (N=59)

| වයස | ගණන | % |
|---|---|---|
| 30 ට අඩු | 7 | 12 |
| 31 - 40 | 24 | 40 |
| 41 - 50 | 14 | 24 |
| 51 ට වැඩි | 14 | 24 |
| මුළු ගණන | 59 | 100 |
| ප්‍රතිචාරයක් නැත | 1 | |

4.2.2 රාජකාරි කටයුතු සඳහා ගත කල කාලය

කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් තුනෙන් එකක් පමණ ඔවුන්ගේ කාලයෙන් අඩක් දක්වා කාර්යාලයේ ගත කර ඇති බවත් ඉතිරි අය තම කාලයෙන් 25% කට අඩු කාලයක් කාර්යාලයේ ගත කර ඇති බවත් 18 වැනි සටහනෙන් පෙනී යයි.

සටහන 18 කාර්යාලයේ ගත කල කාලය අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස ( N= 60)

| ප්‍රමාණය | ගණන | % |
|---|---|---|
| 25% කට අඩු | 40 | 67 |
| 26% - 50% | 20 | 33 |
| 50% ට වැඩි | - | - |
| මුළු ගණන | 60 | 100 |

පොල් සංවර්ධන නිලධාරීන් මාසයේ සාමාන්‍යයෙන් වැඩ කරන දින 20 න් දින හතරක් කාර්යාලයේ වැඩ සඳහාද, දින දෙකක් කෘෂිකර්ම පලදාව වර්ධන කමිටු රැස්වීම්වලටද, වෙන් කර ඇති බැවින් නිවාඩු දින නොඑළඹුනහොත් දින 14 ක් ඔවුන්ගේ ක්ෂේත්‍ර කටයුතු සඳහා ඉතිරිව තිබේ. ඒ කෙසේ වෙතත් ඔවුන් ප්‍රකාශ කළේ, ඔවුන්ගේ කාලයෙන් වැඩි කොටසක් මිඩංගු වන්නේ අවසර පත් නිකුත් කිරීම සහ පොහොර, තෘණ හා පාංශු සංරක්ෂණය ආදියේ සහනාධාර ක්‍රම සම්බන්ධ වැඩවලට බවය. මෙම කටයුතු හා පරිපාලන කටයුතු සඳහා ඔවුන්ගේ වැඩ කරන කාලයෙන් 60% ක් පමණ ගත වන අතර ඉතිරි කාලය සාමාන්‍ය උපදේශක කටයුතු සඳහා මිඩංගු කරනු ලැබේ.

4.2.3 මෙහෙයුම් ක්ෂේත්‍ර

සාමාන්‍යයෙන් කෘෂිකාර්මික උපදේශකවරයෙක් පලදාව වර්ධන කමිටු එකක් හෝ දෙකක් ඇතුළත් වන ප්‍රදේශයක කටයුතු කරන අතර පොල් සංවර්ධන නිලධාරියෙකුට පලදාව වර්ධන කමිටු තුනක් පමණ අයත් ප්‍රදේශයක සිය සේවා සපයයි. මුළු දිස්ත්‍රික්කයටම සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන් දෙදෙනෙක් පමණක් සිටින බැවින් ඔවුන්ගේ මෙහෙයුම් ක්ෂේත්‍රය වඩාත් විශාල වන්නේය. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයෙක් ගොවි කාරක සභා දෙකක් හෝ තුනකට අදාළ ක්ෂේත්‍රයක කටයුතු කරයි. 19 වැනි සටහනෙන් පෙන්නුම් කරන්නේ සේවය ලැබිය යුතු ගොවි පවුල් සංඛ්‍යාව හා ඇත්ත වශයෙන්ම සේවය ලැබූ ගොවි පවුල් සංඛ්‍යාවයි.

සටහන 19 කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයකුට වෙන් කර ඇති ගොවි පවුල් ගණන හා 1973/74 මහ කන්නයේදී ඔහුට හමු වූ ගොවි පවුල්වල ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 57)

| | ක්ෂේත්‍රයේ පවුල් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ සංඛ්‍යාව | % | සේවයක් ලැබුණ පවුල් ගණන කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ සංඛ්‍යාව | % |
|---|---|---|---|---|
| 500 ට අඩු | - | - | 21 | 37 |
| 501 - 1000 | 14 | 25 | 13 | 23 |
| 1001 - 1500 | 6 | 10 | 11 | 19 |
| 1501 - 2000 | 4 | 7 | 9 | 16 |
| 2001 - 2500 | 6 | 10 | 3 | 5 |
| 2501 - 3000 | 9 | 16 | - | - |
| 3000 ට වැඩි | 18 | 32 | - | - |
| මුළු ගණන | 57 | 100 | 57 | 100 |
| ප්‍රතිචාරයක් නැත | 3 | | 3 | |

### 4.2.4 අනිකුත් ආයතන සමඟ සම්බන්ධතාවය

කෘෂිකර්ම ව්‍යාප්තියේ අරමුණ නම් කෘෂිකර්ම සංවර්ධනය හා ග්‍රාමීය ජීවන තත්වය දියුණු කිරීමයි. මෙම අරමුණුවල සාර්ථකත්වය රඳා පවතින්නේ ගැමි ජනතාවට පරිපාලනමය, ද්‍රව්‍යමය හා අධ්‍යාපනික සහායක් ලැබෙන පරිදි ව්‍යාප්ති සේවකයින් හා විවිධ ග්‍රාමීය ආයතන අතර පවතින සහයෝගීතාවය මතය.

(අ) <u>පලදාව වර්ධන කමිටු හා ගොවි කාරක සභා:</u> කෘෂිකර්ම උපදේශක වරුන්ගෙන් 67% ක්ද, කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් 28% ක්ද පලදාව වර්ධන කමිටුවල කාර්යයන් හොඳින් දැන සිටිත්. ඊට වැඩි ප්‍රමාණයක් (කෘෂිකර්ම උපදේශක වරුන්ගෙන් 83% ක්ද, කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් 48% ක්ද) ගොවි කාරක සභාවල කාර්යයන් අවබෝධ කරගෙන සිටියහ (20 වැනි සටහන).

සටහන 20 කෘෂිකර්ම පලදාව වර්ධන කමිටුවල හා ගොවි කාරක සභාවල කාර්යයන් පිළිබඳ දැනීම අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 58)

| | පලදා වර්ධන කමිටු | | | | ගොවි කාරක සභා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කෘෂිකර්ම උපදේශකවරු | | කෘෂිකර්ම ව්‍යාප්ති සේවක | | කෘෂිකර්ම උපදේශකවරු | | කෘෂිකර්ම ව්‍යාප්ති සේවක | |
| | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % |
| හොඳින් දනී | 12 | 67 | 16 | 28 | 15 | 83 | 28 | 48 |
| තරමක් දනී | 6 | 33 | 37 | 64 | 3 | 17 | 22 | 38 |
| නොදනී | - | - | 5 | 8 | - | - | 8 | 14 |
| මුළු ගණන | 18 | 100 | 58 | 100 | 18 | 100 | 58 | 100 |
| ප්‍රතිචාරයක් නැත | | | 2 | | | | 2 | |

කෘෂිකර්ම පලදාව වර්ධන කමිටු රැස්වීම්වලට පැමිණීම ගැන සැලකූවිට කෘෂිකර්ම උපදේශක වරුන්ගෙන් 67% ක් සෑමවිටම රැස්වීම්වලට සහභාගී වූ අතර 33% ක් බොහෝවිට සහභාගී වූහ. පොළේ සංවර්ධන නිලධාරීහු මාසයකට රැස්වීම් දෙකකටවත් සහභාගී වෙති. සහභාගීත්වය බොහෝවිට තමන් සේවය කළයුතු පලදාව වර්ධන කමිටු සංඛ්‍යාව මත බලපායි. 21 වැනි සටහනෙන් දැක්වෙන්නේ කෘෂිකර්ම පලදාව වර්ධන කමිටු සම්බන්ධයෙන් තමන්ගේ කාර්ය භාරය කෘෂිකර්ම උපදේශක වරුන් විසින් වටහා ගනු ලැබ ඇති අන්දමයි. 78% ක්, කෘෂිකර්ම පලදාව වර්ධන කමිටුවලට ශිල්පීය උපදේශකවරයෙකු ලෙස තමන්ගේ කාර්ය භාරය වඩාත් වැදගත් ලෙස සැලකූහ.

සටහන 21 කෘෂිකර්ම පලදාව වර්ධන කමිටුවල වැඩ සම්බන්ධව ඔවුන්ගේ කාර්ය අනුව කෘෂිකර්ම උපදේශක වරුන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | විද්‍යාත්මක උපදේශකයකු ලෙස | | තොරතුරු සැපයීමට හා වැඩසටහන් සැලසුම් කිරීමට උපකාර වීම | | පලදා වර්ධන කමිටු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | |
|---|---|---|---|---|---|---|
| | ගණන | % | ගණන | % | ගණන | % |
| ඉතා වැදගත් | 14 | 78 | 2 | 11 | 2 | 12 |
| වැදගත් | 3 | 17 | 7 | 39 | 8 | 44 |
| එතරම් වැදගත් නැත | 1 | 5 | 9 | 50 | 8 | 44 |
| මුළු ගණන | 18 | 100 | 18 | 100 | 18 | 100 |

(ආ) සමුපකාරය: සමුපකාරවල ගබඩා කළයුතු යෙදවුම් වර්ගය වැනි කරුණු පිළිබඳව සමුපකාර කළමනාකරුවෝ කෘෂිකර්ම උපදේශකවරුන් 17% කගෙන්ද, කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් 14% කගෙන්ද තොරතුරු විමසා ඇති නමුත්, එවැනි ඉල්ලීම්, කෘෂිකර්ම උපදේශකයින්ගෙන් 50% ක් සහ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් 38% ක් වෙත ලැබී නැත (22 වෙනි සටහන).

සටහන 22 ශිල්පීය කරුණු පිළිබඳව සමුපකාර කළමනාකරුවන්ගෙන් ඉල්ලීම් ලැබී ඇති කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සහ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස

| | කෘෂිකර්ම උපදේශක (N= 18) | | කෘෂිකර්ම ව්‍යාප්ති සේවක (N= 58) | |
|---|---|---|---|---|
| | ගණන | % | ගණන | % |
| නිතර | 3 | 17 | 8 | 14 |
| යම් අවස්ථාවලදී | 6 | 33 | 28 | 48 |
| කලාතුරකින් | 5 | 28 | 17 | 29 |
| කිසිවිටක නැත | 4 | 22 | 5 | 9 |
| මුළු ගණන | 18 | 100 | 58 | 100 |
| ප්‍රතිචාරයක් නැත | | | 2 | |

මෙම අධ්‍යයනයෙන් පෙනී ගියේ සමුපකාර වලින් ණය ගැනීම සඳහා වූ ගොවීන්ගේ ඉල්ලුම්පත් සකස් කිරීමේ කාර්යයෙහි ලා කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 28% ක් නිරත වූ බවත්, 55% ක් මෙවැනි කාර්යයක් ඉතා කලාතුරකින් කර ඇති බව හෝ කිසිවිටක කර නොමැති බවත්ය. කෘෂිකර්ම උපදේශක වරුන්ගෙන් 17% ක් බැංකු ණය සඳහා වූ ගොවීන්ගේ ඉල්ලුම්පත් පරීක්ෂා කර ඇති අතර 66% කට මෙවැනි ඉල්ලීම් ලැබී ඇත්තේ ඉතා කලාතුරකිනි; නැතහොත් කිසිසේත් ලැබී නැත (23 වෙනි සටහන). බැංකු ණය ලැබුණු ගොවීන්ගේ නාම ලැයිස්තුවක් කිසිම කෘෂිකර්ම උපදේශකවරයෙක් වෙත ලැබී නැත.

සටහන 23 බැංකු ණය පිළිබඳ ගොවීන්ගේ ඉල්ලුම්පත් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම උපදේශක වරුන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N= 18)

| | ගණන | % |
|---|---|---|
| නිතර | 3 | 17 |
| යම් අවස්ථාවලදී | 3 | 17 |
| කලාතුරකින් | 2 | 11 |
| කිසිවිටක නැත | 10 | 55 |
| මුළු ගණන | 18 | 100 |

### 4.2.5 නිලධාරීන් අතර සම්බන්ධතාවය

ව්‍යාප්ති සේවය යහපත් ක්‍රියාකාරී දර්ශනයක් සේ නිතර කැටි කර දක්වා ඇත්තේ "තමන්ටම උදව් කර ගැනීමට ගැමි ජනතාවට උදව් දීමය" යනුවෙනි. එය "එක්වුතුව ක්‍රියා කරන" ක්‍රමයකි. එමගින් අදහස් කෙරෙනුයේ, ව්‍යාප්ති සේවකයින්, ග්‍රාමීය ප්‍රදේශවල අනිකුත් නිලධාරීන් හා ගොවීන් අතර ඉතා කිට්ටු සහයෝගීතාවයකි. ඒ කෙසේ වෙතත් මෙම අධ්‍යයන යෙන් පෙනී ගියේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් හා පොල් සංවර්ධන නිලධාරීන් අතර සම්බන්ධතාවය ඉතාමත් අඩු බවයි. 25 වැනි සටහනෙන් පෙනී යන පරිදි, පොල් වගාව පිළිබඳ තොරතුරු ගොවීන් විසින් නිතර කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් විමසනු ලැබුවද සෑම ව්‍යාප්ති සේවකයින් ගෙන් හතරෙන් එකක් පමණක් පොල් සංවර්ධන නිලධාරීන් හමු වී ඇති බව 24 වෙනි සහටනින් හෙළිදරව් වේ.

සටහන 24 පොල් සංවර්ධන නිලධාරීන් හමු වීම පිළිබඳව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N= 58)

| ප්‍රමාණය | ගණන | % |
|---|---|---|
| නිතර | 15 | 26 |
| කලාතුරකින් | 31 | 53 |
| කිසිවිටක නැත | 12 | 21 |
| මුළු ගණන | 58 | 100 |
| ප්‍රතිචාරයක් නැත | 2 | |

සටහන 25 පොල් වගාව පිළිබඳව තොරතුරු සඳහා ගොවීන් විසින් කරන ලද ඉල්ලීම අනුව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N= 58)

| තොරතුරු විමසීමේ ප්‍රමාණය | ගණන | % |
|---|---|---|
| නිතර නිතර | 6 | 10 |
| නිතරම | 13 | 22 |
| සමහර අවස්ථාවලදී | 31 | 54 |
| කලාතුරකින් | 8 | 14 |
| කිසිවිටක නැත | - | - |
| මුළු ගණන | 58 | 100 |
| ප්‍රතිචාරයක් නැත | 2 | |

කෘෂිකර්ම උපදේශක වරුන්ගෙන් අඩක් පොල් සංවර්ධන නිලධාරීන්ටද, 17% ක් සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ටද නිතර හමු වී ඇත (26 වෙනි සටහන).

සටහන 26 පොල් සංවර්ධන නිලධාරීන් හා පුළුව අපනයන බෝග ව්‍යාපෘති නිලධාරීන් හමුවීම පිළිබඳව කෘෂිකර්ම උපදේශක වරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | පොල් සංවර්ධන නිලධාරීයා | | පුළුව අපනයන බෝග ව්‍යාපෘති නිලධාරීයා | |
|---|---|---|---|---|
| | ගණන | % | ගණන | % |
| නිතරම | 9 | 50 | 3 | 17 |
| යම් අවස්ථාවලදී | 5 | 28 | 3 | 17 |
| කලාතුරකින් | 3 | 17 | 10 | 55 |
| කිසිවිටක නැත | 1 | 5 | 2 | 11 |
| මුළු ගණන | 18 | 100 | 18 | 100 |

නිලධාරීන් හමු වීමට අමතරව ක්ෂේත්‍ර කටයුතු සම්බන්ධයෙන්ද ඇත්තේ අඩු සම්බන්ධී කරණයකි. 27 වැනි සටහනේ ඇති පරිදි කෘෂිකර්ම ව්‍යාපෘති සේවකයින්ගෙන් අඩක් පොල් සංවර්ධන නිලධාරීන් සමඟ කිසිවිටක ක්ෂේත්‍ර චාරිකාවන්හි යෙදී නැත. මෙවැනිම ප්‍රමාණයක කෘෂිකර්ම ව්‍යාපෘති සේවකයින් පවසා ඇත්තේ, පොල් සංවර්ධන නිලධාරීන් සමඟ ක්ෂේත්‍ර චාරිකාවන්හි යෙදීම ඉතාමත් වැඩදායක බවය.

සටහන 27 පොල් සංවර්ධන නිලධාරීන්ගේ ක්ෂේත්‍ර ගමන්වලට වර්තමාන සහභාගීත්වය අනුව කෘෂිකර්ම ව්‍යාපෘති සේවකයින්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N = 57)

| සහභාගීවීමේ ප්‍රමාණය | වර්තමානය | | අවශ්‍යතාවය පළ කළ | |
|---|---|---|---|---|
| | ගණන | % | ගණන | % |
| සියළුම චාරිකාවලට | – | – | 8 | 14 |
| බොහෝ චාරිකාවලට | 4 | 7 | 28 | 49 |
| යම් අවස්ථාවලදී | 25 | 44 | 21 | 37 |
| කිසිවිටක නැත | 28 | 49 | – | – |
| මුළු ගණන | 57 | 100 | 57 | 100 |
| ප්‍රතිචාරයක් නැත | 3 | | 3 | |

පොල් සංවර්ධන නිලධාරීන්ගේ හා පුළුව අපනයන බෝග ව්‍යාපෘති නිලධාරීන්ගේ වැඩ කටයුතු පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ දැනුමේ ප්‍රමාණය 28 වැනි සටහනේ දැක්වේ. පිළිවෙලින් පොල් සංවර්ධන නිලධාරීන්ගේ හා පුළුව අපනයන බෝග ව්‍යාපෘති නිලධාරීන්ගේ කටයුතු පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 39% ක් හා 33% දෙනෙක් දැනගෙන සිටියහ.

ඒ කෙසේ වෙතත් කෘෂිකර්ම උපදේශක වරුන්ගෙන් 17% දෙනෙකුට සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ගේ කටයුතු පිළිබඳව දක්වා නැත.

සටහන 28 පොල් සංවර්ධන නිලධාරීන්ගේ හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ගේ කටයුතු පිළිබඳව කෘෂිකර්ම උපදේශක වරුන්ගේ දැනුමේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | ක්ෂේත්‍ර නිලධාරියා | | | |
|---|---|---|---|---|
| | පොල් | | සුළු අපනයන බෝග | |
| | ගණන | % | ගණන | % |
| දනී | 7 | 39 | 6 | 33 |
| තරමක් දනී | 11 | 61 | 9 | 50 |
| නොදනී | – | – | 3 | 17 |
| මුළු ගණන | 18 | 100 | 18 | 100 |

ප්‍රාදේශීය මට්ටමේදී කෘෂිකර්ම උපදේශක වරුන්ගෙන් 67% ක් සහ 33% ක් තම වැඩ කටයුතු පිළිවෙලින් පොල් සංවර්ධන නිලධාරීන් හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කර ඇත. 29 වෙනි සටහනින් පෙන්නුම් කර ඇති පරිදි ග්‍රාමීය මට්ටමෙහිදීද දක්නට ඇත්තේ මේ හා සමාන තත්වයකි.

සටහන 29 පොල් සංවර්ධන නිලධාරීන් හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන් සමඟ කෘෂිකර්ම උපදේශකවරු තම වැඩ කටයුතු සම්බන්ධීකරණය කර ඇති අන්දමේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | ප්‍රාදේශීය මට්ටමෙන් | | | | ග්‍රාමීය මට්ටමෙන් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පොල් | | සුළු අපනයන බෝග | | පොල් | | සුළු අපනයන බෝග | |
| | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % |
| ඔව් | 12 | 67 | 6 | 33 | 11 | 61 | 6 | 33 |
| නැත | 6 | 33 | 12 | 67 | 7 | 39 | 12 | 67 |
| මුළු ගණන | 18 | 100 | 18 | 100 | 18 | 100 | 18 | 100 |

කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 39% ක් සහ 78% ක් අදහස් කළේ පිළිවෙලින් පොල් සංවර්ධන නිලධාරීන්ගේ හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ගේ සේවාවන් කෘෂිකර්ම උපදේශකවරුන් මගින් ගොවීන් වෙත ලබා දිය යුතු බවය. එසේම 30 වෙනි සටහනේ දැක්වෙන පරිදි කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 27% හා 67% කගේ අදහස වූයේ පිළිවෙලින් පොල් සංවර්ධන නිලධාරීන්ගේ හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ගේ සේවාවන් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් මගින් ගොවීන් හට ලබා දිය යුතු බවයි.

සටහන 30 පොල් සංවර්ධන නිලධාරීන් හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන්ගේ කාර්යයන් කෘෂිකර්ම උපදේශකවරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් මගින් සම්බන්ධීකරණය කළ යුතුය යන අදහස අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස

(N = 18)

| | කෘෂිකර්ම උපදේශකවරුන් | | | | කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පොල් | | සුළු අපනයන බෝග | | පොල් | | සුළු අපනයන බෝග | |
| | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % |
| ඔව් | 7 | 39 | 14 | 78 | 5 | 27 | 12 | 67 |
| නැත | 11 | 61 | 4 | 22 | 13 | 73 | 6 | 33 |
| මුළු ගණන | 18 | 100 | 18 | 100 | 18 | 100 | 18 | 100 |

31 වෙනි සටහන අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 22% ක්ද, කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් 29% ක්ද පාසැල්වල කෘෂිකර්මය උගන්වන ගුරුවරුන් නිතර හමු වී ඇති අතර කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 22% ක් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් 19% ක්ද ඉතාමත් කලාතුරකින් ඔවුන් හමු වී ඇත. කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 33% ක් හා කෘෂිකර්ම ව්‍යාප්ත සේවකයින්ගෙන් 26% ක් කිසිවිටක විවිධ ව්‍යාප්ති කටයුතුවලට සහභාගී වන ලෙස පාසැල් ගුරුවරුන්ට ආරාධනා කර නැත. ඒ කෙසේ වෙතත් කෘෂිකර්ම උපදේශකවරු මෙන්ම කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ද අදහස් කළේ, ශ්‍රමදාන ව්‍යාපාර, ආදර්ශක පිළියෙල කිරීම, ගෙවතු වගා කිරීම, තරුණ ගොවි සමාජවල වැඩකටයුතු වැනි කාර්යයන්හිදී කෘෂිකර්මය පිළිබඳ ගුරුවරුන් සහාය කරගත හැකි බවය.

සටහන 31 කෘෂිකර්ම ගුරුවරුන් හමුවීම හා ව්‍යාප්ති කටයුතුවලට සහභාගී වීමට ඔහුට ආරාධනා කිරීම අනුව කෘෂිකර්ම උපදේශකවරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | කෘෂිකර්ම උපදේශක | | | | කෘෂිකර්ම ව්‍යාප්ති සේවක | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | හමුවීම | | ආරාධනා කිරීම | | හමුවීම | | ආරාධනා කිරීම | |
| | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % |
| නිතරම | 4 | 22 | 2 | 11 | 17 | 29 | 6 | 10 |
| යම් අවස්ථා වලදී | 10 | 56 | 8 | 45 | 30 | 52 | 20 | 35 |
| කලාතුරකින් | 4 | 22 | 2 | 11 | 11 | 19 | 17 | 29 |
| කිසිවිටක නැත | - | - | 6 | 33 | - | - | 15 | 26 |
| මුළු ගණන | 18 | 100 | 18 | 100 | 58 | 100 | 58 | 100 |
| ප්‍රතිචාරයක් නැත | | | | | 2 | | 2 | |

### 4.2.6 පර්යේෂණ හා පුහුණුකිරීම

ව්‍යාප්ති ක්‍රියාවලියේදී පුද්ගලයෙකුගේ හැකියාවට වෙන ආදේශකයක් නැත. පර්යේෂණ කටයුතු පිළිබඳව දැනගෙන සිටීම හා කාලීන පුහුණුව මෙම හැකියාව කෙරෙහි බලපෑමක් ඇති කරයි. ක්ෂේත්‍රයේ ව්‍යාප්ති නිලධාරියා හා පර්යේෂණ නිලධාරියා අතර ද්වි-මාර්ග තොරතුරු හුවමාරුව නිරතුරුවම සවිමත්ව පවත්වාගෙන යා යුතු වේ.

(අ) මෙම අධ්‍යයනයෙන් පෙනී ගියේ කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 28% ක් පර්යේෂණ ආයතනවල කෙරෙන පර්යේෂණ වැඩසටහන් පිළිබඳව නොදන්නා බවයි. 67% ක් දෙනා ඒ පිළිබඳව මඳ වශයෙන් දැනගෙන සිටියහ. මෙම තත්වය 32 වෙනි සටහනෙන් දැක්වේ.

සටහන 32 කරගෙන යනු ලැබෙන පර්යේෂණ වැඩසටහන් පිළිබඳව දැනුම අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | ගණන | % |
|---|---|---|
| අවබෝධයක් ඇත | 1 | 5 |
| තරමක අවබෝධයක් ඇත | 12 | 67 |
| අවබෝධයක් නැත | 5 | 28 |
| මුළු ගණන | 18 | 100 |

(ආ) 1974 වර්ෂය තුළදී කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 55% ක් පමණ තොරතුරු සඳහා පර්යේෂණ නිලධාරීන් වෙත දෙතුන් වරක් ඉල්ලීම් කර ඇති අතර 28% ක් මෙම කාලය තුළ මේ පිළිබඳ කිසිදු ඉල්ලීමක් කර නැත. ක්ෂේත්‍ර ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ තොරතුරුවල ඇති අදාළ බව ගැන සැලකූවිට ඒවා කෙලින්ම අදාළ වන්නේ යැයි අදහස් කළේ කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් තුනෙන් එකක් පමණකි. ඒවා අදාළ නොවන්නේ යැයි 22% ක් අදහස් කළහ (33 වැනි සටහන).

සටහන 33 ක්ෂේත්‍ර ගැටළු සඳහා ලැබුණ පර්යේෂණ තොරතුරුවල ඇති අදාළ බව මත කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | ගණන | % |
|---|---|---|
| අදාළය | 6 | 33 |
| තරමක් අදාලය | 8 | 44 |
| අදාළ නැත | 4 | 22 |
| මුළු ගණන | 18 | 100 |

(ඇ) කෘෂිකර්ම උපදේශකවරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් පුහුණුකිරීම සම්බන්ධයෙන් පසුගිය වර්ෂ තුන තුළදී කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගෙන් 50% ක් කිසිම සේවා සංස්කරණ අභ්‍යාස පාඨමාලාවකට සහභාගී වී නැති අතර 90% ක් දෙනා අභ්‍යාසමාලා 1-3 කට පමණ සහභාගී වී ඇත. 34 වැනි සටහනෙන් දැක්වෙන්නේ කෘෂිකර්ම උපදේශකවරුන් පුහුණුව ලැබූ නොයෙකුත් විෂයයන්ය.

සටහන 34 පුහුණු පංතිවලට සහභාගීවීම අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය - ප්‍රතිශතයක් ලෙස (N = 18)

| විෂයයන් | ගණන | % |
|---|---|---|
| සත්ව පාලනය | 9 | 50 |
| කෘෂිකාර්මික ව්‍යාප්තිය | 6 | 33 |
| එළවළු බෝග වගාව | 6 | 33 |
| අනිකුත් බෝග | 6 | 33 |
| වී | 5 | 28 |

කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගෙන් තුනෙන් දෙකක් කියා සිටියේ පුහුණුව තම කටයුතුවලට අදාළ බවය. අනෙකුත් අයගේ අදහස වූයේ පුහුණුව ක්ෂේත්‍ර ගැටළුවලට තරමක් අදාළ බවයි. 35 වැනි සටහනෙන් දැක්වෙන්නේ, කෘෂිකර්ම උපදේශක වරුන්ට ලැබුන සේවා සංස්කරණ අභ්‍යාස මාලාවල වැදගත්කම පිළිබඳව ඔවුන්ගේ අදහස්ය.

සටහන 35 සිය වැඩ කටයුතු කිරීමේදී සේවා සංස්කරණ අභ්‍යාස මාලා උපකාර වූ අන්දම අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | ගණන | % |
|---|---|---|
| බොහෙවින් උපකාර වී ඇත | 10 | 55 |
| තරමක් උපකාර වී ඇත | 5 | 28 |
| උපකාර වී නැත | 3 | 17 |
| මුළු ගණන | 18 | 100 |

අනාගත පුහුණුකිරීම් දියුණු කළහැකි අන්දම පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ යෝජනා 36 වැනි සටහනේ ඇත.

සටහන 36 අනාගත පුහුණුකිරීම් දියුණු කිරීමට ඉදිරිපත් කළ යෝජනා අනුව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ව්‍යාප්තිය – ප්‍රතිශතයක් ලෙස (N = 18)

| | ගණන | % |
|---|---|---|
| ක්ෂේත්‍ර ගැටළුවලට අදාළ විය යුතුයි | 8 | 44 |
| දිස්ත්‍රික්කවල පැවැත්වීම | 4 | 22 |
| දැනට වඩා ප්‍රායෝගික වැඩ | 3 | 17 |
| වැඩියෙන් ක්ෂේත්‍ර චාරිකා | 3 | 17 |
| පර්යේෂණ සොයා ගැනීම් ගැන මීට වඩා අවබෝධයක් ලබා දීම | 3 | 17 |
| පුහුණුකිරීම් සඳහා උසස් නිලධාරීන්ගේ මීට වඩා සහභාගිත්වය | 3 | 17 |

කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් 57% ක් ව්‍යාප්ති මූලධර්ම හා ක්‍රම පිළිබඳවද, 35% ක් විවිධ නිෂ්පාදනයට යෙදවුම් භාවිතය පිළිබඳවද, 32% ක් වගා ක්‍රම පිළිබඳවද, තවත් සමහරක් අතුරු බෝග වගා කිරීම සහ පාංශු හා ජල පාලනය පිළිබඳවද මීට වඩා පුහුණුවක් ලැබීමට මනාපය පළ කළ බව අධ්‍යයනයෙන් පෙනී ගියේය.

ඒ කෙසේ වෙතත් කෘෂිකර්ම උපදේශකවරු වී වගාව, ක්ෂේත්‍ර බෝග වගාව, සත්ව පාලනය, ජල පාලනය, පලතුරු බෝග හා උක් වගාව වැනි විෂයයන් පිළිබඳව වැඩි කැමැත්තක් දැක්වූහ.

කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් පුහුණු කිරීම පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරුන්ගේ යෝජනාව වූයේ කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 83% ක් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් වී වගාව

පිළිබඳව පුහුණු කළයුතු යැයි සැලකූ බවයි. 72% ක් බඩ ඉරිඟු, ඉඳල් ඉරිඟු, සෝයා බෝංචි වගාව පිළිබඳව පුහුණුවක් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකවරුන්ට දිය යුතු යයි යෝජනා කළ අතර 33% දෙනෙකු සත්ව පාලනය හා එළවළු වගාව පිළිබඳ පුහුණුවක් දිය යුතු බව පළ කළහ.

(ඈ) පොල් සංවර්ධන නිලධාරීන් ගැන සැලකූවිට ඔවුන් පොල් පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලයෙන් කොටසක් ලෙස සේවය කළවිට පර්යේෂණ හා ව්‍යාප්තිය අතර ඉතා කිට්ටු සම්බන්ධතාවයක් තිබුනේ යැයි පැවසිනි. නමුත් අළුතින් පොල් පර්යේෂණ මණ්ඩලය හා ඔවුන් අයිති පොල් වගා කිරීමේ මණ්ඩලය යනුවෙන් මණ්ඩල දෙකක් ඇති වුන පසු ඔවුන් පොල් වගා කිරීම පිළිබඳ වැදගත් පර්යේෂණ හා විද්‍යාත්මක තොරතුරු වලින් ඈත් වී ඇති බව ඔවුන්ගේ හැඟීමයි. දැන් ඔවුන්ගේ ප්‍රධාන සම්බන්ධතාවය විෂය පිළිබඳ උපදේශක පත්‍රිකා මගින් පමණි. ඒ කෙසේ වෙතත් ඔවුන්ට අතුරු බෝග වගා කිරීම පිළිබඳ සේවා සංස්කරණ පුහුණුවක් ලැබී ඇත.

(ඉ) කොළඹ දිස්ත්‍රික්කයේ තරුණ ගොවි සමාජ 139 ක් ඇති අතර එයින් 55 ක් ලේඛනගත කර ඇත. තරුණ ගොවි සමාජ ව්‍යාපාරය නොයෙක් අතින් හොඳ දෙයක් බව සියළුම කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් අනුමත කළහ. ගොවි සමාජ නියැලෙන ප්‍රධාන කටයුතු නම් ශ්‍රමදාන ව්‍යාපාර, වී හා අල බෝග වගා කිරීම, ගෙවතු වගා කිරීම, සත්ව පාලනය, මීමැසි පාලනය, එළවළු වගා කිරීම, මැහුම් වැඩ හා රෙදි විවීම යනාදියයි. මෙම සමාජවලට නිෂ්පාදන යෙදවුම් හා ඉඩම් රජය විසින් දිය යුතු යයි යෝජනා විය.

### 4.2.7 සන්නිවේදන

ගොවීන් අතර තොරතුරු ප්‍රචාරය සඳහා භාවිතා කල ඇතැම් මාධ්‍යයන් වූයේ, සඟරා, පත්‍රිකා, ගුවන්විදුලිය හා චිත්‍රපටිය.

(අ) මෙම අධ්‍යයනයෙන් පෙනී ගියේ 'ගොවිකම් සඟරාව' කෘෂිකාර්මික සඟරාව උදෙසා නිතැතින්ම ඇතිවුන ඉල්ලුමක් නොමැති බවත්, එහි විකිණීම් සෑමවිටම කෘෂිකර්ම උපදේශකවරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගේ බලවත් ඉල්ලීම මත සිදු වී ඇති බවත්ය. මෙම සඟරාවේ සඳහන් වන විෂයයන් පිළිබඳව, ගොවීන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් අතර සාකච්ඡා පැවතුනේ මඳ වශයෙනි.

(ආ) උපදේශ පත්‍රිකා ගොවීන් අතර නොමිලේ බෙදා හැරීමට ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොලැබෙන බව කෘෂිකර්ම උපදේශක වරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් ප්‍රත්‍යක්ෂ කළහ. කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 86% ක් මෙම ඌණතාවය පෙන්වා දුන්හ.

(ඇ) උපදේශ පත්‍රිකා මෙන්ම චිත්‍රපටි දර්ශන සඳහාද අධික ඉල්ලුමක් තිබුනද මෙහිදීද මෙම ඉල්ලුමට සරිලන ප්‍රමාණයක සැපයුමක් නොවීය. චිත්‍රපටි දර්ශන සඳහා වූ ඉල්ලුම් වලට ප්‍රතිචාරයක් ලැබුනේ යයි සිතන ලද්දේ කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් 6% ක් හා කෘෂිකර්ම

ව්‍යාප්ති සේවකයින්ගෙන් 5% ක් පමණක් විසිනි.

(ඇ) ගුවන්විදුලි වැඩසටහන් ප්‍රයෝජනවත් ලෙස සළකන ලදී. ඒ කෙසේ වෙතත් ගුවන් විදුලිය විසින් නිවේදනය කළ යුත්තේ යම් අවස්ථාවකදී ලබා ගත හැකි කෘෂිකාර්මික යෙදවුම් පමණක් පිළිබඳව බව ඔවුන්ගේ හැඟීමයි. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයෝ ශ්‍රද්ධාවෙන් මෙම වැඩසටහන්වලට සවන් දෙති. මෙම වැඩසටහන්වලදී ගොවීන්ගේ කටහඬවල්, නිලධාරීන්ගේ කටහඬවල්වලට වඩා නිතර නිතර ප්‍රචාරය විය යුතු බව යෝජනා විය.

5. නිගමන

1. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්, කෘෂිකාර්මික උපදේශකවරුන් හා පොල් සංවර්ධන නිලධාරීන් පිළිබඳ දැනුමක් අපේක්ෂා කළ තරම් ගොවීන් අතර නොතිබේ. පළාතේ ගොවීන්ගෙන් වැඩි කොටසකට ශිල්පීය ආධාර හා උපදෙස් දීමටද ඔවුනට හැකියාවක් නැත.

   කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් හට ගොවීන් විශාල සංඛ්‍යාවක් උදෙසා තම සේවය ඉටු කළ යුතු වුවද ඔවුන්ට ප්‍රවාහන පහසුකම් නැත. එසේම ඔවුන්ගේ කාලයෙන් සෑහෙන කොටසක් පරිපාලන කටයුතු සඳහා මිඩංගු වේ. කෘෂිකර්ම උපදේශක වරුන්ටද තම කාලයෙන් සෑහෙන කොටසක් පරිපාලන කටයුතු සඳහාත්, නිෂ්පාදන යෙදවුම් පිළිබඳ ගොවීන්ගේ අවශ්‍යතා සඳහාත් යෙදවීමට සිදු වේ. මෙනයින්ම පොල් සංවර්ධන නිලධාරීන්ටද සමහරවිට පලදා වර්ධන කමිටු එකක් හෝ දෙකක් හෝ ඊට වැඩි ගණනක බල ප්‍රදේශ අයත් වන ක්ෂේත්‍රයක සේවය කිරීමට සිදු වී ඇති අතර ඔවුන් ප්‍රධාන වශයෙන් සම්බන්ධවී ඇත්තේ ගොවීන් හට දෙනු ලැබෙන නොයෙකුත් සහනාධාර ක්‍රමයන් පරිපාලනය කිරීමේ කාර්යයෙහිය. මෙම තත්වය නිසා ගොවීන්ගේ අවශ්‍යතා නිසියාකාරව සපුරාලිය නොහැකි වී ඇත.

2. ගොවීන් වැඩි දෙනෙක් මුහුණ දෙන ක්ෂේත්‍ර ගැටළුවලට පිළියම් සඳහා අනෙකුත් ගොවීන් කෙරෙහි විශ්වාසය තැබීමෙන් පෙනී යන්නේ, කෘෂිකර්ම ව්‍යාප්ති සේවක, කෘෂිකර්ම උපදේශක හා පොල් සංවර්ධන නිලධාරීන් වැනි ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ සේවාවන් අවශ්‍ය වේලාවට නොලැබීමයි; එසේ නැතහොත් ප්‍රායෝගික තොරතුරු හා සහාය ලබා දීමට මෙම නිලධාරීන් තුළ ඇති හැකියාව කෙරෙහි විශ්වාසය අඩුවීම නිසා මෙවැන්නක් සිදුවනවා විය හැක.

3. ගොවීන්ට ණය ලබාගත හැකි මාර්ග පිළිබඳ ඇති තොරතුරු ඉතා මඳය. ණය ලබා ගත් පසු එය ඉතාමත් හොඳින් භාවිතා කළයුතු අන්දම පිළිබඳ තොරතුරු ඊටත් වඩා අඩුය. සමූපකාරවල කවර ආකාරයක යෙදවුම් කවර ප්‍රමාණයකින් ගබඩා කළයුතුද යන්න පිළිබඳ තොරතුරු සඳහා සමූපකාර කළමනාකරුවෝ

කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ශිල්පීය විශේෂත්වය හෝ ව්‍යාප්ති සේවකයින්ගේ පළපුරුද්ද උපයෝගී කරගෙන ඇත්තේ ඉතා අඩුවෙනි. එසේම ගොවීන්ට ණය ලබා දීමේදී කෘෂිකර්ම උපදේශකවරුන්ට දිය හැකි උපකාර පිළිබඳව බැංකු කළමනාකරුවන් අගය කර නැත.

4. ගොවීන් විසින් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයෝ සලකන ලද්දේ කෘෂිකාර්මික යෙදවුම් ලබා දෙන මාර්ගයක් ලෙසය. පොල් සංවර්ධන නිලධාරීන් පිළිබඳවද පැවසිය යුත්තේ මෙම තත්වයමය. සංවර්ධන නිලධාරීන් හා ගොවීන් පුහුණු කරන්නන් වශයෙන් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් සතු කාර්ය භාරය බොහෝ ගොවීන් අවබෝධ කරගෙන නැත. එසේම පොල් වගාව පිළිබඳ ගැටළු සඳහා උපදේශ හා ආධාර ලබා ගැනීමට ගොවීන් ඉතා සුළු සංඛ්‍යාවක් පමණක් පොල් සංවර්ධන නිලධාරීන් හමුවී ඇත. ක්ෂේත්‍ර දිනයන් හා පුහුණු කිරීමේ පංතිවලට ගොවීන්ගේ පැමිණීම අඩු වුවත් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් නොයෙකුත් බාධක මධ්‍යයේ මෙම පංති පැවැත්වීමෙන් සෑහෙන කාර්ය භාරයක් සපුරා ඇත. උගන්වනු ලබන විෂයයන්, කාලය හා එම පංති පැවැත්වෙන ස්ථාන ගැන වඩාත් සැළකිලිමත් වීමෙන් මීට වඩා වැඩියෙන් ගොවීන්ගේ සහභාගිත්වය උනන්දු කිරීමට ව්‍යාප්ති නිලධාරීන්ට හැකි බව පෙනී යයි. මෙය වඩාත් වැදගත් වන්නේ පොල් සංවර්ධන නිලධාරීන් පොල් වගාව පිළිබඳව ගොවි පුහුණු පංති හා ආදර්ශන පැවැත්වීම නවත්වා ඇති නිසාය.

5. තරුණ ගොවි සමාජ ව්‍යාපාරයේ අරමුණ හා දර්ශණය අනාගත ගොවීන් හා සමාජයීය නායකයින් බිහි කිරීම බව ගොවීන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට හරිහැටි අවබෝධයක් නැත. මීට වඩා දැනුමක් මේ පිළිබඳව ලබා දීමෙන් මෙම සමාජවල කටයුතු කෙරෙහි ගොවීන්ගෙන් වැඩි සහභාගිත්වයක් හා දායකත්වයක් ලබා ගත හැක.

6. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් හා කෘෂිකර්ම උපදේශකයින්ගෙන් වැඩි දෙනෙක් වැදගත් හා අදාළ සේවා සංස්කරණ පුහුණුවක් ලබා ඇත. ඒ කෙසේ වෙතත් වර්තමාන කෘෂිකාර්මික ගැටළු පිළිබඳ දැනුම හා ඔවුන්ගේ පළපුරුද්ද පුළුල් කිරීමට තවත් පුහුණුකිරීම් අවශ්‍ය බව පෙනී යයි. මෙම පුහුණුකිරීම් දිස්ත්‍රික්කය තුළ කළයුතු අතර ප්‍රායෝගික මෙන්ම ක්ෂේත්‍ර ගැටළුවලට අදාළ විය යුතුය. ප්‍රදේශයේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් සැළකිය යුතු වැඩ කොටසක් ඉටු කළයුතු නම්, මෙම විෂයය පිළිබඳ වැඩිදුරටත් පුහුණුවක් ඔවුනට ලබා දීම වැදගත්ය.

7. තම ප්‍රදේශවල පලදා වර්ධන කමිටු හා ව්‍යාප්ති මධ්‍යස්ථාන පිළිබඳව ගොවීන් යම්තමින් දැනගෙන සිටියද මෙම ආයතන වලින් දෙනු ලබන ආධාර හා සේවා පිළිබඳව ඔවුන් නොදනී. ඒ කෙසේ වෙතත් දැනට කෘෂිසේවා මධ්‍යස්ථාන හෝ ව්‍යාප්ති මධ්‍යස්ථානවලට ගොස් ඇති සුළු ප්‍රමාණයක ගොවීන් එසේ ගොස් ඇත්තේ ප්‍රාථමික වශයෙන් කෘෂිකාර්මික යෙදවුම් ලබා ගැනීමට හෝ ඔවුන්ගේ ඉඩම් ආරවුල් නිරාකරණය කර ගැනීමටය. එසේම කෘෂිකර්ම උපදේශකවරුන්ද, කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ද, පලදා වර්ධන කමිටු හා

ගොවි කාරක සභා අතර ඇති සම්බන්ධතාවය නිසා කෘෂිකර්ම පලදාව වර්ධන කමිටු හා ගොවි කාරක සභාවල අරමුණු හා කාර්යයන් පිළිබඳව මනා දැනුමක් ඔවුන්ට ලබා දීම අත්‍යවශ්‍යය.

8. ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරුන්, පොල් සංවර්ධන නිලධාරීන් හා සුළු අපනයන බෝග ව්‍යාප්ති නිලධාරීන් අතර තරමක අදහස් හුවමාරුවක් පවතී. ඒ කෙසේ වෙතත් පොල් වගාව පිළිබඳ නොයෙකුත් ගැටළු සම්බන්ධයෙන් ගොවීන් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකවරුන්ගෙන් ප්‍රශ්න කලද, ක්ෂේත්‍රයේදී කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් හා පොල් සංවර්ධන නිලධාරීන් අතර පවතිනුයේ ඉතා මඳ සම්බන්ධතාවයකි. මෙයින් පෙනී යන්නේ ප්‍රදේශයේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා මෙම නිලධාරීන් දෙගොල්ලගේම කාර්යයන් ක්‍රමවත් වන පරිදි පොල් සංවර්ධන නිලධාරීන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් අතර කාර්යමය සම්බන්ධතාවයක් තිබිය යුතු බවයි.

9. මීට වඩා ගොවීන් සංඛ්‍යාවක් ගුවන්විදුලි වැඩසටහන් දෙස කැමුරු කර ගැනීමටත්, අළුත් වැඩි දියුණු ශිල්පීය ක්‍රම ප්‍රචාරය කර හැරීමටත් වර්තමාන ගුවන්විදුලි ගොවි වැඩසටහන් නැවත සකස් කළ යුතුය.

ගොවි පුහුණු වැඩකටයුතු වැඩි දියුණු කිරීමට හා අළුත් ශිල්ප ක්‍රම හා අදහස් ගොවීන්ට කියා දීමේ ක්‍රමයක් ලෙස කෘෂිකාර්මික චිත්‍රපටිවල වැදගත්කම පිළිබඳව කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් ප්‍රමාණවත් අයුරින් සොයා බලා නැත.

'ගොවිකම් සඟරාව' හා 'ගොවි ජනතාව' යන කෘෂිකාර්මික සඟරා දෙකේ ස්වරූපය හා ඒවායේ අඩංගු කරුණු ඉතා ප්‍රවේසමෙන් පරීක්ෂා කළයුතු අතර වර්තමාන බෙදා හැරීමේ ක්‍රමය සමාලෝචනය කළ යුතුය. බොහෝ ගොවීන්ට දියුණු අධ්‍යාපන තත්වයක් ඇති බැවින් ඔවුනට දැනුම ලබා දීමේදී මෙම සඟරාවලට වැදගත් කාර්යයක් ඉටු කළ හැක.

10. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් මෙන්ම කෘෂිකර්ම උපදේශකවරුන්ද පාසැල්වල කෘෂිකර්මය උගන්වන ගුරුවරුන් සමඟ සෑහෙන අදහස් හුවමාරුවක් හා සමාජයීය සම්බන්ධතාවයක් පවත්වාගෙන ඇත. කෙසේ වෙතත් විවිධ ව්‍යාප්ති ක්‍රියාවලියන්හි ලා කෘෂිකාර්මික ගුරුවරුන්ට දිය හැකි ආධාර හා උපකාර මෙම ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් උපයෝගී කරගෙන ඇත්තේ ඉතා සුළු වශයෙනි.

11. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් වැඩි දෙනෙක් තමන්ගේ කාර්යයන් පිළිබඳව සෑහීමකට පත්ව ඇති අතර ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා කෙළින්ම ඔවුන් දායක වන බව ඔවුන්ගේ අදහසයි. මෙවැනි අදහස් නිරතුරුවම පවත්වා ගත යුතු අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන ආධාර වලින් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය දියුණු කළ යුතුයි.

12. පවත්වාගෙන යනු ලබන පර්යේෂණ වැඩමාලා පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරුන් අවබෝධ කරගෙන ඇත්තේ මඳ වශයෙන් වුවත්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් පර්යේෂණවල වැදගත්කම දන්නා අතර ක්ෂේත්‍ර ගැටළුවලට පිළියම් පර්යේෂණ නිලධාරීන්ගෙන් බලාපොරොත්තු වේ. කෘෂිකර්ම උපදේශකවරුන්ට ලැබෙන පර්යේෂණ තොරතුරු ක්ෂේත්‍රයේ පවතින ප්‍රායෝගික තත්වයන්ට නිරතුරුවම අදාළ නොවන බව පෙනී යයි.

13. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් හතරෙන් එකක් පමණ වයස අවුරුදු 51 කට වැඩි බැවින් විශේෂයෙන් ප්‍රවාහන පහසුකම් නොමැතිව ක්ෂේත්‍ර ව්‍යාප්ති සේවකයින් ලෙස තම කාර්යය සපුරාලීමට අපහසුවී ඇත. කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ගෙන් වැඩි දෙනෙකුට දිගු කාලයක ක්ෂේත්‍ර අත්දැකීමක් තිබුනද ඔවුන්ට ඇත්තේ කෘෂිකර්මය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා සහතිකයක් පමණි. එමනිසා ඔවුන්ගේ ශිල්පීය දැනුම දියුණු කිරීමට තවදුරටත් සේවා සංස්කරණ පුහුණුකිරීමේ වැඩසටහන් අවශ්‍ය වේ.

6. නිර්දේශ

කෘෂිකර්ම ව්‍යාප්තියේ ප්‍රධාන අරමුණ නම් ගොවීන්ගේ සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට, ඔවුන්ට යම් යම් තොරතුරු, අත්දැකීම් හා හැකියාවන් ලබා දීමෙන්, ගොවීන්ගේ දියුණුව තුළින් ඵලදායීතාවය වැඩි කිරීම හා ඉඩම් සංවර්ධනය කිරීමයි. මෙම අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා දැනට පවතින රටාවේ ඇතැම් වෙනස්කම් සිදු කිරීම අවශ්‍ය වන අතර මේ හේතුකොටගෙන අවසාන වශයෙන් ව්‍යාප්ති සේවකයාගේ කාර්යය වඩාත් ඵලදායී වනු ඇත.

1. ව්‍යාප්ති කාර්යාවලිය සඳහා ගොවීන්ගේ සහභාගීවීම සහ ආධාර හා උපදෙස් පිළිගැනීම ගොවීන්ගේ කැමැත්තෙන්ම කරන්නාවූ දෙයකි. එමනිසා ව්‍යාප්ති ක්‍රියාවලිය සාර්ථක වීමට නම්, ව්‍යාප්ති සේවකයින්, ගොවීන්ගේ විශ්වාසය දිනා ගැනීම ඉතා වැදගත්ය. මෙය සාර්ථකව විසඳිය හැක්කේ ගොවිපල ගැටළු හා ඒවාට යෙදිය යුතු පිළියම් ගැනද මනා දැනුමක් හා වැටහීමක් ඇති කර ගැනීමෙන් පමණකි. එමනිසා පහත සඳහන් නිර්දේශ යෝජනා කෙරේ.

(අ) ක්‍රියාකාරී ක්ෂේත්‍රයේ පවතින ශිල්පීය ගැටළු පිළිබඳව දැනුම හා අත්දැකීම් ලබා දීමට ව්‍යාප්ත සේවකයින්ට නිතර සේවා සංස්කරණ පුහුණුවීම් සඳහා අවස්ථා ලබා දිය යුතුය. මෙම පුහුණුකිරීම්වලට තොරතුරු පතුරුවා හැරීමේ සුදුසු ක්‍රම, ව්‍යාප්ත ක්‍රියාවලියන්හි මූලධර්ම හා වැඩිහිටි අධ්‍යාපනය වැනි විෂයයන් ඇතුළත් විය යුතුයි. මෙම පුහුණුව අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස සැළකිය යුතු අතර එය අළුත් ශිල්ප ක්‍රම පිළිබඳව ව්‍යාප්ත සේවකයන්ට දැනුම් දෙන්නාවූ මාර්ගයක් ලෙස සැළකිය යුතුයි. එය ප්‍රදේශයේ ගැටළු හා තත්වයන් වටහා ගැනීම ගැන සැළකිලිමත් වන බැවින්, ප්‍රළාත්බද එකක් විය යුතුයි. මෙම පුහුණුකිරීම පරිපාලන හා ශිල්පීය අංශයෙන් සැලකූවිට දිස්ත්‍රික්ක හා පලදා වර්ධන කමිටු මට්ටමේ පැවැත්වීම වඩාත් සුදුසු බව පෙනේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පොල් පර්යේෂණ මණ්ඩලය හා සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල විශේෂඥ නිලධාරීන්ගේ ආධාරය ඇතිව දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ට හා කෘෂිකර්ම උපදේශකවරුන්ට මෙම පාඨමාලා සංවිධානය කළ හැක.

(ආ) ව්‍යාප්ති නිලධාරීන් ඔවුන්ගේ ක්‍රියාකාරී ක්ෂේත්‍රයේ 'අනුගාමී කණ්ඩායමක්' ඇති කළ යුතුයි. විවිධ ප්‍රතිපල ඇති කරන අදහස්' පුද්ගලික ගොවීන් සමඟ සූක්ෂම ලෙස වැඩ කිරීමෙන් මෙය ඉටු කරගත හැක. සාර්ථක ගොවීන්ගේ ක්‍රියා කලාපය අනුගමනය කිරීමට වැඩි හරියක් ගොවීහු නැඹුරු වීමෙන් යහපත් වැඩ කොටස පැතිර යන්නේය. ප්‍රවීණතාවය හා හැකියාව සංස්ථාපනය වූ පසු, ව්‍යාප්ති නිලධාරීන්ට බෝග ගණනාවක් සඳහා (...) හා වැඩි දියුණු ක්‍රම භාවිතය ගැන සැළකිලිමත් වීමට පිළිවන.

(ඈ) දැනට තිබෙන සංනිවේදන මාර්ග මගින් සිය සේවය සලසාලිය යුතු ගොවීන්ගෙන් බොහෝ දෙනෙකුට කාලීන උපදෙස් හා උපකාර සපයා දීමට කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට නොහැකි තරම්ය. එමනිසා ගොවි පවුල් 1500 කට වැඩි සංඛ්‍යාවක් එක් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයෙකුට අනුයුක්ත නොකළ යුතු යැයි යෝජනා කෙරේ.

(ඇ) කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට තමන්ගේ රාජකාරි කටයුතු නිසියාකාර කිරීමට අවශ්‍ය දැනුම හා පළපුරුද්ද අවුරුදු එකක ශාස්ත්‍රීය පුහුණුවකින් ලබා දිය නොහැක. ක්‍රමයෙන් මෙම එක් අවුරුදු ඩිප්ලෝමා සහතික සහිත අය වෙනුවට දෑවුරුදු ඩිප්ලෝමා සහතික සහිත අය යෙදවීමෙන් හා උපාධිධාරී කෘෂිකර්ම උපදේශකවරු නිරත කරවීමට අනාගතයේ ඇති හැකියාව පිළිබඳව සැලකීමෙන් ග්‍රාමීය ශුභසාධනය දියුණු කිරීමට හා පලදායිතාවය වැඩි කිරීමට කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය වඩාත් ශක්තිමත් ලෙස උපයෝගී කරගත හැකි වනු ඇත.

(ඉ) පලදායිතාවය වැඩි කිරීමට හා සම්පත් වඩා සුදුසු අන්දමින් භාවිතා කිරීම සඳහා ප්‍රදේශයේ ගොවීන්ට උපදෙස් හා ආධාර දීමට යොමු වී ඇති රජයේ නොයෙකුත් නිලධාරීන්ගේ සම්බන්ධීකරණය හා සහයෝගීතාවය ඉතා වැදගත්ය. පහත සඳහන් කරුණු යෝජනා කෙරේ:

I. කෘෂිකර්ම පලදා වර්ධන කමිටුවෙහි හෝ දිස්ත්‍රික් කාර්යාලයෙහි සිට කටයුතු කරන පොල් සංවර්ධන නිලධාරීන් පහත සඳහන් කාර්යයන් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් මගින් කළ යුතුයි.

(අ) විවිධ සහනාධාර යෝජනා ක්‍රම සඳහා ඉල්ලුම්පත් ගොවීන්ට බෙදා හැරීම;

(ආ) පොල් නිෂ්පාදනය පිළිබඳ නොයෙකුත් කටයුතු ගැන සැලකිල්ලක් දක්වන ගොවීන් හමුව ඔවුන් පොල් සංවර්ධන නිලධාරීන් වෙත යොමු කිරීම;

(ඇ) හැකි සෑම අවස්ථාවකදීම පොල් නිෂ්පාදනයේ මූලික කරුණු පිළිබඳව ගොවීන්ට උපදෙස් දීම.

II. කෘෂිකර්ම පලදා වර්ධන කමිටු හා ගොවි කාරක සභා පිළිබඳ දර්ශනය, ඒවායේ අරමුණු හා කාර්යයන් පිළිබඳව කෘෂිකර්ම උපදේශකවරුන්ට හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට වඩා දැනුමක් ලබා දිය යුතුය. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආයතන හා පලදා වර්ධන නීති අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය ඇතිව මෙම ක්ෂේත්‍රයෙහි පුහුණුවක් ව්‍යාප්ති නිලධාරීන්ට ලබා දිය යුතුය.

III. ප්‍රදේශයට ඇත්ත වශයෙන්ම අවශ්‍ය නිෂ්පාදන යෙදවුම් හා ගොවි උපකරණ සමූපකාර රවල ගබඩා කිරීම ඉතා අවශ්‍යය. කෘෂිකාර්මික උපදේශකවරු අවශ්‍ය විවිධ යෙදවුම් හා ගොවි උපකරණ ලැයිස්තුවක් සමූපකාර කළමනාකරුවන්ට ලබා දිය යුතු අතර මෙම ලැයිස්තුව වරින් වර අලුත් කළ යුතුය. එසේම

සමූපකාර කළමනාකරුවන්ට හෝ සමූපකාරවල කෘෂිකාර්මික යෙදවුම් විකිණීම බාර අයට කෙටිකාලීන පුහුණුකිරීම් පාඨමාලා සංවිධානය කිරීමට කෘෂිකර්ම උපදේශකවරුන්ට පිළිවන.

IV. බැංකු වලින් හෝ සමූපකාර වලින් හෝ ගොවීන්ගේ ණය පිළිබඳ අයදුම්පත් පරීක්ෂා කර ඒ පිළිබඳව අදහස් දැක්වීමට කෘෂිකර්ම උපදේශකවරුන්ට අවස්ථාව තිබිය යුතුයි. මීට අමතරව, ණය ලබා ගත් අයගේ නම් ඔවුන් විසින් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට ලබා දිය යුතුය. එවිට මෙම ණය මුදල් වඩාත් සුදුසු ලෙස භාවිතා කළහැකි ක්‍රම පිළිබඳව ගොවීන්ට උපදෙස් දීමට කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට හැකි වන්නේය.

V. කෘෂිකර්ම උපදේශකවරුන්ගේ හා කෘෂිකර්ම ව්‍යාප්ත සේවකයින්ගේ අභ්‍යාස ලබා ග්‍රාමීය පාසැල්වල කෘෂිකර්ම ගුරුවරුන් හට විවිධ ව්‍යාප්ත කාර්යයන්ට උපකාර කිරීමෙන්ද, ප්‍රධාන වශයෙන් ගොවීන් හා තරුණ ගොවි සමාජවල සාමාජිකයින් පුහුණු කිරීමෙන්ද, ආදර්ශනයන් හා ව්‍යාප්ත රැස්වීම් සංවිධානය කිරීමෙන්ද වඩාත් පලදායී කාර්යයන් ඉටු කළ හැක. තරුණ ගොවි සමාජ සාමාජිකයින් සඳහා ආදර්ශන බිම් කට්ටියක් ලෙස පාසැල් වත්ත යොදා ගැනීමද, ගෘහ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ගොවිකටයුතු කිරීම මෙන්ම ගැමි පවුල් කටයුතු උදෙසා සහාය දීමටද කෘෂිකර්මය උගන්වන ගුරුවරුන්ට හැකි වන්නේය.

2. කෘෂිකාර්මික උපදේශකවරුන්ට දැනට ඇති පරිපාලන කටයුතු සම්භාරයෙන් ඔවුන් මුදවා හැරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැදගත් ප්‍රයත්නයක් දැරිය යුතුය. යථා කාලයේදී එක් කෘෂිකර්ම උපදේශකවරයෙක් එක් එක් කෘෂිකර්ම පලදා වර්ධන කමිටුවකට අනුයුක්ත කළවිට ඇතැම් පරිපාලන කටයුතු ලිපිකරුවකුට පැවරීමට පිළිවන් විය හැක. එසේම කෘෂිකර්ම උපදේශකවරුන් බීජ වර්ග, රෝපණ ද්‍රව්‍ය වැනි නිෂ්පාදන යෙදවුම් බෙදා හැරීමේ ලා මැදිහත් නොවිය යුතුයි. මෙය පලදා වර්ධන කමිටුවලට කළ හැක.

3. කෘෂිකර්ම උපදේශකවරුන් තමාගේ කාලයෙන් වැඩි කොටසක් පහත සඳහන් කාර්යයන්ට මිඩංගු කළ යුතු වේ:

(අ) සංවර්ධන වැඩසටහන් සැළසුම් කිරීමේදී කෘෂිකර්ම පලදා වර්ධන කමිටුවලට සහාය වීම හා ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් සහ ගොවි කාරක සභා සමඟ ඉතා කිට්ටුවෙන් කටයුතු කිරීම;

(ආ) කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට ශිල්පීය දැනුම ලබා දීම;

(ඇ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ශිල්පීය අංශ හා අනිකුත් අදාළ රජයේ ආයතනවල උපකාරය ඇතිව, කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට සේවා සංස්කරණ අභ්‍යාස පාඨමාලා සංවිධානය කිරීම;

(ඈ) ගොවි පුහුණු පංති හා ක්ෂේත්‍ර දිනයන් සංවිධානය කිරීමට කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට උපකාර කිරීම;

(ඉ) කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ අංශ, විශේෂයෙන් පර්යේෂණ අංශ හා අනිකුත් රජයේ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණ නිලධාරීන් සේ ක්‍රියා කිරීම.

4. ගොවීන් විසින් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් වෙත යොමු කරනු ලබන ගැටළු වලින් විශාල ප්‍රමාණයක් විවිධ නිෂ්පාදන යෙදවුම් ලබා ගැනීම සම්බන්ධයෙන් වුවත්, කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් වැඩි වශයෙන් ක්‍රියා කළ යුත්තේ සම්පත් වලින් වැඩි ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා ගොවීන්ට දැනුම හා අත්දැකීම ලබා දීමේ අරමුණ සහිතව ගමෙහි වැඩිහිටියනට උගන්වන්නෙක් ලෙසටය. මෙවැනි ස්වරූපයක් ගැනීමට කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් ඔවුන්ගේ කාලයෙන් වැඩි කොටසක් ගොවීන් පුහුණුකිරීම, ක්ෂේත්‍ර දිනයන් පැවැත්වීම හා ආදර්ශයන් පැවැත්වීම වැනි ක්‍රියාවන්ට ගත කළ යුතුයි. ප්‍රදේශයේ විවිධ අංශවල සංවර්ධනය සඳහා වැඩි දෙනෙකුගේ, විශේෂයෙන් ගොවි කාරක සභාවල සාමාජිකයින්ගේ සහභාගිත්වය දිරි ගැන්වීමට ඔවුන් තමන්ගේ ක්‍රියාවලියන් මීට වඩා පුළුල් කළ යුතු වේ.

5. ගොවි සඟරා, උපදෙස් පත්‍රිකා, චිත්‍රපටි හා ගුවන්විදුලිය ශිල්පීය තොරතුරු ගොවීන්ට පතුරුවා හැරීමේ මාධ්‍යයන් ලෙස දැනට ඇති වැඩදායක බව තවදුරටත් පරීක්ෂා කළ යුතුය. මේ අතරම ගොවීන්ගේ අධ්‍යාපන තත්වය සෑහෙන තරම් දියුණු බැවින් ව්‍යාප්ති සන්නිවේදන මාධ්‍යයන් සේ දැන්වීම් පත්‍රිකා ආදිය භාවිතා කළහැකි බව යෝජනා වී ඇත. මේවායේ අඩංගු විය යුතු දෑ එම ප්‍රදේශයට සරිලන සේ සකස් විය යුතුයි. එසේම සත්‍ය වූ ගැටළු පිළිබඳ අවබෝධයක් ලබා දීමේ මාධ්‍යයක් ලෙස භාවිතා කිරීමෙන් ගුවන් විදුලි වැඩසටහන්වල වැඩදායක බව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කළ හැක. ගුවන්විදුලිය තුළින් ගොවීන්ගේ කටහඬවල් වැඩියෙන් ඇසීමට සැලැස්වීමෙන් ඒවායේ ජනප්‍රියත්වය ගොවීන් අතර වැඩි වන්නාත් මෙන්ම ඔව්හූ ඒවා පිළිගැනීමටද පෙළඹෙන්නාහ.